මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT
- 2020 -







ශ්‍රම වාසනා අරමුදල
சிரம வாசனா நிதியம்
SHRAMA VASANA FUND

වාර්ෂික වාර්තාව - 2020

සම්පාදනය:
ශ්‍රම වාසනා අරමුදල

ප්‍රකාශනය:
ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රකාශන කමිටුව

සියලුම හිමිකම් ඇවරිණි
2020



වාර්ෂික වාර්තාව
2020

ශ්‍රම වාසනා අරමුදල

පටුන

ආයතනික තොරතුරු

01. ශ්‍රම වාසනා අරමුදල හා එහි අරමුණු	01
02. මෙහෙවර හා දැක්ම	02
03. මූලික අගයන් සහ චර්යාධර්ම	02
04. ශ්‍රම වාසනා අරමුදලේ අභ්‍යන්තර පරිසරය	03
05. ආයතනය සතු සම්පත්	03
06. ශුදුඅත විශ්ලේෂණය	04-05
07. ඉදිරි අභියෝග සහ වගකීම්	06
08. පාලන ව්‍යුහය	07
09. සංවිධාන සටහන	08
10. අනු කමිටු	09-10
11. විගණන හා කළමණාකරණ කමිටු තීරණ	11-14
12. ලොතරැයි ආදායම සහ විශ්ලේෂණාත්මක වාර්ථාව	15-18
13. මූල්‍ය කාර්යසාධන සමාලෝචනය	19-21
14. 1998 - 2020 විශේෂ අවස්ථා	22-23
15. අරමුදලේ කාර්යසාධනය	24-28

මූල්‍යමය තොරතුරු

16. මූල්‍ය තත්ව ප්‍රකාශය	29
17. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	30
18. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය	30
19. මුදල් ප්‍රවාහ ප්‍රකාශය	31
20. ගිණුම්කරණ ප්‍රතිපත්තිය	32-36
21. ගිණුම්වලට අදාල සටහන්	37-41
22. විගණකාධිපති වාර්තාව	42-49
23. අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය	50-52
ඇමුණුම	53

ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ (2019 අංක 15 දරණ සංශෝධිත) පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල මුදල් අමාත්‍යංශය යටතේ පවතින කම්කරු සුභ සාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු 7ක් ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභ සාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදලට අරමුදල් සැපයෙන ප්‍රධාන ප්‍රවාහය වන්නේ බ්‍රහස්පතින්දා හා සෙනසුරාදා යන දිනවල ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වනු ලබන ජාතික සම්පත ලොතරැයියෙන් ලැබෙන ආධායමයි. මෙම අදායම ලොතරැයි අලෙවිය අනුව තීරණය වන අතර, අදායම් තත්වයන් අනුව සිදුකරනු ලබන වැඩසටහන් වසරින් වසර වර්ධනය සිදුවේ.

අරමුදලේ අරමුණු

01 සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.

02 සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.

03 හදිසි අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.

04 සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.

05 ව්‍යවසන අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම.

06 සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

කම්කරු කොමසාරිස් ජනරාල්වරයා කම්කරු විනිශ්චය සභාවක් බේරුම්කරුවකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරාවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබා ගැනීමට මූල්‍යමය සහන සැලසීම.

දැක්ම හා මෙහෙවර

දැක්ම

"තෘප්තිමත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්"

මෙහෙවර

"කම්කරු ප්‍රජාවට සුභසාධනය සැපයීම හා විපතකදී පිහිටවීම සඳහා පවතින යාන්ත්‍රණයන්ගේ අඩුපාඩු පුරවමින් වඩා පොහොසත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම"

මූලික අගයන් සහ චර්යාධර්ම

- ශ්‍රම වාසනා අරමුදල මගින් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සඳහා කාර්යක්ෂම වූ සේවාවක් සැපයීම සඳහා වන සදාචාරාත්මක බැඳීම තහවුරු කිරීම.
- සේවාලාභීන් සඳහා සේවා සැපයීමේදී ශ්‍රම වාසනා අරමුදලේ නීති රෙගුලාසි හා ක්‍රමවේදයන් ට යටත්ව ඉහල ගුණාත්මක සේවාවක් ලබා දීම.
- ශ්‍රම වාසනා අරමුදල මගින් සිදු කරනු ලබන සේවාවන් පිළිබඳව සේවා ලාභීන් තුළ වඩා දැනුවත් භාවයක් ඇති කිරීම.

ශ්‍රම වසනා අරමුදලේ අභ්‍යන්තර පරිසරය

අංක 97 ජාවත්ත පාර කොළඹ 05, දරන ලිපිනයේ ඇති ගොඩනැගිල්ලේ 2 වන මහලේ ශ්‍රම වසනා අරමුදලේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත. බිම් ප්‍රමාණය වර්ග අඩි 1500 ක් පමණි. කාර්යාල ප්‍රදේශය වායුසමනය කර ඇත. මෙම කාර්යාලයට වාහනයකින් පහසුවෙන් ප්‍රවේශ විය හැකි නමුත් එය ප්‍රධාන බස් මාර්ගයක පිහිටා නොමැති බැවින් සමහර ගනුදෙනුකරුවන්ට පැමිණීමට යම් අපහසු තාවයක් ඇත. වත්මන් කාර්ය මණ්ඩලයේ කාර්යාලීය අවශ්‍යතා සපුරා ගැනීමට දැනට පවතින ඉඩ ප්‍රමාණවත් නමුත් ගබඩා සඳහා ප්‍රමාණවත් ඉඩක් නොමැත.

අරමුදල සතු සම්පත්

මානව සම්පත්

සාමාන්‍යාධිකාරී, කළමනාකරු, ගණකාධිකාරී, සහකාර කළමනාකරු, හා කළමනාකරණ සේවා නිළධාරීන් අට දෙනෙක්, කාර්යාල සහකාරවරු දෙදෙනෙක්, රියදුරන් දෙදෙනෙක් වශයෙන් සමන්විත වේ.

භෞතික සම්පත්

පරිගණක 13ක්, ඡායා පිටපත් යන්ත්‍ර දෙකක්, ෆැක්ස් යන්ත්‍රයක්, ලැප්ටොප් හතක්, කළු සුදු මුද්‍රණ යන්ත්‍ර තුනක්, වර්ණ මුද්‍රණ යන්ත්‍රයක්, වායු සමීකරණ යන්ත්‍ර පහක්, කැමරාවක්, හඬ පටිගත කිරීමක්, CCTV කැමරා පද්ධතියක් ශබ්ධ වාහිණී යන්ත්‍රයක්, ගෘහ භාණ්ඩ සහ උපාංග - මේස දහතුනක්, පුටු දහතුනක්, සෝෆා කට්ටලයක්, සාකච්චා මේසයක් හා පුටු, ටෙන්ඩර් පෙට්ටියක්, මෝටර් රථයක් සහ වෑන් රථයක්.

අරමුදලේ කීර්තිනාමය

ශ්‍රම වසනා අරමුදල විසින් මෙතෙක් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් කම්කරුවන්ගේ යහපැවැත්මට සහ සේවක සුභසාධනය ප්‍රවර්ධනය සඳහා නිසැකවම දායක වී ඇත. එබැවින්, එහි ආරම්භයේ සිටම නිර්මාණය කර පවත්වාගෙන යන කීර්තියක් හා ප්‍රතිරූපයක් ශ්‍රම වසනා අරමුදල සතුව තිබේ. “ශ්‍රම වාසනා” යන නාමය රජයේ සේවා සපයන සංවිධානයකට වඩා ලොතරැයියක් ලෙස ජනතාව අතර ප්‍රචලිතය.

අරමුදලේ (SWOT- Analysis) ශුදුඅත විශ්ලේෂණය

බාහිර පරිසරය අධ්‍යනය කිරීමේ අරමුණ වන්නේ ශ්‍රම වසනා අරමුදලට බලපාන අවස්ථා සහ තර්ජන හඳුනා ගැනීමයි. අභ්‍යන්තර පරිසරය පරීක්ෂා කිරීම එහි ශක්තීන් සහ දුර්වලතා හඳුනා ගැනීමයි. SWOT විශ්ලේෂණය මඟින් අරමුදලේ උපාය මාර්ගික දිශානතිය, ඉලක්ක සහ අරමුණු නිර්ණය කිරීමට පහසුකම් සපයනු ලබයි.

01. ශක්තීන්

- අරමුදලේ සැලකිය යුතු විශාලත්වය, ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය වන හොඳින් ස්ථාපිත ලොතරැයියය.
- ලොතරැයි ආදායම හැර විවිධ ක්‍රියාකාරකම් හරහා සහ විවිධ මූලාශ්‍රවලින් අරමුදල පුළුල් කිරීමේ හැකියාව.
- ශක්තිමත් රාජ්‍ය ආයතන කිහිපයක පිටුබලය; කම්කරු දෙපාර්තමේන්තුවේ සහයෝගය, මුදල් අමාත්‍යාංශය සහ ජාතික ලොතරැයි මණ්ඩලය.
- පාර්ලිමේන්තු පනතක් මගින් අනුබල දෙන ශක්තිමත් නීති රාමුවක් තිබීම.
- ත්‍රෛපාර්ශ්වික සංඝටක නියෝජනය කරන පළපුරුදු සහ දක්ෂ සාමාජිකයින්ගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් තිබීම.
- සුදුසුකම් ලත් සහ දක්ෂ කාර්යමණ්ඩලයක් සිටීම.
- ISO 9001:2015 තත්ත්ව පාලන පද්ධතියක් තිබීම.
- වෙබ් අඩවියක් සහ වෙබ් පාදක පද්ධතියක් තිබීම.
- මෝටර් රථයක් සහ වෑන් රථයක් සතු වීම.

02. දුර්වලතා

- සමස්ත වෙළඳපොළට ලොතරයිපත් සැපයීමට නොහැකි වීම, වෙළෙඳපොළ ඉතා විශාල වීම සහ සංවිධානය කුඩා වීම, විමධ්‍යගත මෙහෙයුමක් සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් හෝ අවශ්‍ය සම්පත් සීමිත වීම.
- ගනුදෙනුකරුවන් ගැන පැහැදිලි අදහසක් නොමැති වීම.
- පසුගිය කාලයේ සේවාදායක කණ්ඩායමට විශාල බලපෑමක් කර නොතිබීම.
- අරමුදලේ සේවාවන් පිරිනමනු ලබන සේවාදායක කණ්ඩායම හෝ සාමාන්‍ය ජනතාව අතර අරමුණු ප්‍රචලිත නොවීම.
- මෙහෙයුම් පුළුල් කිරීම සඳහා ශ්‍රම වාසනා ලොතරැයිය අලෙවිය වර්ධනය නොවීම.
- ලොතරැයි අලෙවියෙන් ලැබෙන ආදායම මත බදු අය කිරීම.
- ශාඛා නොමැති අතර එබැවින් බාහිර මෙහෙයුම් සඳහා කම්කරු දෙපාර්තමේන්තුව මත යැපීමට සිදුවේ.

03. අවස්ථාවන්

- විශාල වෙළඳපලක් පවතින අතර සංස්ථාපන පනත මගින් අරමුදලට ලබා දී ඇති පුළුල් බලතල අනුව විෂය පථය පුළුල් කිරීමේ හැකියාවක් පවතී.

- තුන්වන ලෝකයේ ශ්‍රම බලකායට ඔවුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා අරමුදල් සැපයීමට කැමැත්තෙන් සිටින රාජ්‍ය නොවන සංවිධාන විශාල සංඛ්‍යාවක් සිටින අතර, අරමුදල සහ එහි ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා ඒවා භාවිතා කළ හැකිය.

- ලොතරැයිපත් මිලදී ගත් අයට යම් සේවා සැපයීමේ දී ප්‍රමුඛතාවයක් ලබා දීම තුලින් ප්‍රතිලාභීන් සහ ආදායම් මාර්ගය (ලොතරැයිය) අතර සම්බන්ධයක් ඇති කර ගැනීමේ හැකියාව.

04. තර්ජන

- ලොතරැයි අතර තරඟයක් පවතින අතර වෙළඳපොලේ බොහෝ ලොතරැයි පැවතීම.

- අරමුදල ලොතරැයිය සමඟ සම්බන්ධ වී ඇති නිසා ලොතරැයි ආදායමට වඩා අමතර මුදල් භාණ්ඩාගාරය හරහා ලබා ගැනීමට අපහසු වේ.

- ලොතරැයිය කළමනාකරණය කිරීම ශ්‍රම වසනා අරමුදලේ නියෝජනයක් නොමැති ජාතික ලොතරැයි මණ්ඩලයේ තනි අභිමතය මත සිදුවීම.

- නව ලොතරැයි වෙළෙඳපොළට හඳුන්වාදීම හේතුවෙන් පවතින ලොතරැයිවල ආදායම පහත වැටීම.

අභියෝග හා සාමාජීය වගකීම්

ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන "ජාතික සම්පත" ලොතරැයිය හා තරඟකාරීව තවත් ලොතරැයි ක්‍රියාත්මක වීමත්, එවැනි විවිධ ලොතරැයි තුලින් පිරිනමන ප්‍රථම තෑග්ග මුදලේ වටිනාකම ඉතා ඉහල අගයක් ගැනීම වැනි හේතුවෙන් එවැනි ලොතරැයි වලට සාපේක්ෂව "ජාතික සම්පත" ලොතරැයි ටිකට් පත් අලෙවිය අඩු මට්ටමක පවතී. මෙම තත්වය අරමුදලේ වර්ධනයට අහිතකර ලෙස බලපාන බැවින් ලොතරැයි අලෙවිය වැඩි කර ගැනීම සඳහා ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩි කිරීමට තීරණය කර ඇත. එසේම පාරිභෝගිකයන්ට ටිකට් පත් අන්තර්ජාලය හරහා මිලදී ගැනීමට හැකිවන පරිදි පහසු ක්‍රම වේදයන් සැලසුම් කිරීම පිළිබඳව ද සාකච්ඡා කරමින් පවතී. ඉදිරියේදී ලොතරැයි ආදායම මත ම පදනම් නොවී විදේශීය ආධාර හා ප්‍රදානයන් ලබා ගැනීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත.

1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනත 2019 අංක 15 ලෙස සංශෝධනය සිදු කල අතර ඒ නිසා වැඩසටහන් සැලසුම් කිරීමේ දී තිබූ ගැටලුකාරී තත්වයන් අවම කර ගැනීමට හැකිවූ අතරම විශේෂයෙන් සේවානියුක්තයන්ගේ යැපෙන්නන් ද ප්‍රතිලාභීන් ලෙස සලකා අරමුදලේ ප්‍රතිලාභ, සේවා නියුක්තයන්ගේ පවුල් ආවරණය වන ලෙස ලබා දීමේ හැකියාව ඇති විය. මෙම සංශෝධනය හරහා ලොතරැයි අලෙවි ප්‍රවර්ධනය හා ප්‍රචාරණ කටයුතු සිදුකිරීමට ශ්‍රම වාසනා අරමුදලට ද බලතල ලැබී තිබේ.

සමාජීය හා පාරිසරික වගකීම්

කර්මාන්තශාලා/ආයතන තුල සිදුවන ව්‍යාත්තීය අනතුරු හේතුවෙන් අසරණ වන හෝ මරණයට පත්වන සේවක සේවිකාවන්ගේ අධ්‍යාපනය ලබන දරුවන් හට ශිෂ්‍යත්ව ලබාදීම සිදුකරන අතරම මෙවැනි අනතුරු පිළිබඳව පූර්ව අවධානය යොමුකොට ඒවා වලක්වා ගැනීම සඳහා අවධානම් සහිත කර්මාන්තශාලා හදුනාගෙන ව්‍යාත්තීය අනතුරු අවම කරගැනීම පිලිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් දීප ව්‍යාප්තව සිදු කරයි. මෙම හේතුව නිසා ම පසු ගිය අවුරුදු කිහිපය තුල කාර්මික අනතුරු වල යම් අඩුවක් හා කාර්මික මරණ ප්‍රමාණයේ අඩු වීමක් සිදුවී ඇති බවත්, ආයතන තුල අනතුරු අවම කරගැනීම පිලිබඳ සංස්කෘතියක් වර්ධනය වීමත් වාර්තා වී ඇත.

බෝනොවන රෝග පිලිබඳ සෞඛ්‍ය වැඩමුළු පැවැත්වීම හා සේවක සේවිකාවන් වෙනුවෙන් ඇස් කණ්නාඩි ලබාදීම වැනි වැඩසටහන් තුලින් සේවක අභිප්‍රේරණය ඇතිවීම නිසා ඔවුන්ගේ සේවාවන් වඩාත් ඵලදායීව යොදාගැනීමට හැකි වූ බව සේව්‍ය හා සේවක යන දෙපාර්ශවය විසින්ම තහවුරු කර ඇති බව ඊට අදාල ප්‍රතිපෝෂණ ආකෘති තුලින් පැහැදිලිවේ.

ජාතික රුක් රෝපණ දිනයට සමගාමීව "ගෝලීය උණුසුම අවමකර ගැනීම සඳහා රුක් රෝපණයේ ඇති වැදගත්කම" පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

පාලන ව්‍යුහය

1998 අංක 12 (2019 අංක 15 දරණ සංශෝධිත) දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල මුදල් අමාත්‍යාංශය යටතේ පවතින අතර අරමුදලෙහි සභාපතිත්වය අරමුදල අයත් රේකීය අමාත්‍යාංශයේ ලේකම් සතු වේ. ශ්‍රම වාසනා අරමුදල් පනතට අනුව අරමුදලේ පාලන කටයුතු පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති අතර අරමුදල කළමනාකරණය හා ඊට අදාල කටයුතු සියල්ලම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හා අධීක්ෂණය යටතේ සිදු කරනු ඇත.

2020 වසරේ ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය

නම	තනතුර
ජූඩ් නිලුක්ෂාන් මහතා	සභාපති
බී.කේ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා	සාමාජික
බී.සී.බී තිලකරත්න මිය	සාමාජික
වයි.කේ ශිරෝමි ජීවමාලා මිය	සාමාජික
ලලිත් කන්නන්ගර මහතා	සාමාජික
සුදන්ත බණ්ඩාර මහතා	සාමාජික
පී.ඩී.එම්.එස් ගමගේ මහතා	සාමාජික
බී.ආර්.සී ගුණවර්ධන මහතා	සාමාජික

කාර්ය මණ්ඩල සංයුතිය -2020-12-31

ජ්‍යෙෂ්ඨ මට්ටම		තෘතීය මට්ටම		ද්විතීය මට්ටම		ප්‍රාථමික මට්ටම		එකතුව		
අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	පුරප්පාඩු
01	01	04	03	08	08	04	04	17	16	01

සංවිධාන සටහන - 2020.12.31



අනු කමිටු

ශ්‍රම වාසනා අරමුදලේ ස්ථාපනය කර ඇති අනු කමිටු

01. අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව,
02. ප්‍රතිලාභ කමිටුව,
03. ප්‍රගති සමාලෝචන කමිටුව,

අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව

ශ්‍රම වාසනා අරමුදලේ අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව ස්වාධීනව ක්‍රියාකරන අංශයක්වේ. මෙම කමිටුවේ මූලික අරමුණ වන්නේ ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු, සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්මේ නිර්ණායක/නිර්දේශ පදනම් කර ගනිමින් අරමුදලේ ආයතනික පාලනය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම ආදී කාර්යන්ට අවශ්‍ය උපදෙස් ලබා දීමයි.

ගිණුම් කටයුතු මෙහෙයවීමේ දී මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණයේ විශ්වසනීයත්වය, වංචා හා අඩුපාඩු වලක්වා ගැනීම, වත්කම් ආරක්ෂා කිරීම වැනි කාර්යන්වලට බලපාන නීති රීති අනුකූලතාවය අරාක්ෂා කරගැනීම පිළිබඳ විමසිලිමත් වීමත් ඊට අවශ්‍ය උපදෙස් ලබා දීමත් සිදු කරයි.

අභ්‍යන්තර විගණන කමිටුවේ ප්‍රධානියා/සභාපති, සෘජුවම අරමුදලේ සභාපති වෙත වාර්තා කරන අතර මෙම විගණන වාර්තා විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

2020 වසරේ විගණන කමිටුව පහත සාමාජිකයින් ගෙන් සමන්විත වේ

නම	තනතුර
බී.සී.බී. තිලකරත්න මිය	භාණ්ඩාගාර නියෝජිත/ කමිටු සභාපති
සුසන්ත බණ්ඩාර මයා	කමිටු සාමාජික
ලලිත් කන්නන්ගර මහතා	කමිටු සාමාජික

විගණන හා කළමනාකරණ කමිටුවේ මූලික කාර්යයන්

01. ශ්‍රම වාසනා අරමුදලේ පවත්නා ගිණුම් තැබීම සහ වාර්තාකරන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ඒවා සමාලෝචනය කිරීම සහ ඇගයීම.

02. අරමුදලේ පුර්ව නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කිසියම් ගැටළු පැන නැගී තිබේ නම් ඒවාට අදාළ බලපෑම් විමර්ෂණය කිරීම.

03. වත්කම් අලාභහානීන් සහ වංචා වලින් ආරක්ෂිතව තිබේ දැයි විශේෂිතව දැන ගැනීම.

04. ගණුදෙනුවල අවශ්‍යතාවය හා ගණුදෙනුවල වල ප්‍රතිලාභ විමර්ෂණය කිරීම, නාස්තිය සහ අසාමාන්‍ය ලෙස වැඩිපුර වියදම් කිරීම, වත්කම් ඉවත් කිරීම තුලින් සිදුවන ලාභ පාඩු සහ වියදම් අඩු කිරීම් වාර්තා පිළිබඳව විමර්ශනය කිරීම.

05. විගණන කමිටු රැස්වීමට පියවර ගැනීම හා විගණන තීරණ සැකසීම අදාළ ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය අංශ ප්‍රධානීන් අතර ඒවා බෙදාහැරීම.

06. විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම.

07. අරමුදලේ සභාපති හෝ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ඉල්ලා සිටින විට විශේෂ විමර්ෂන පැවැත්වීම.

08. අරමුදලේ සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කරනු ලබන විවිධ කමිටු වලට සහයවීම හා නිර්දේශ ලබාදීම.

ප්‍රතිලාභ කමිටුව

ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු වලට අනුව සිදුකරන ශිෂ්‍යත්ව ලබාදීම, වෛද්‍යාධාර ලබාදීම, නීති ආධාර ලබාදීම යන වැඩසටහන් වලට අදාල ව ප්‍රතිලාභීන් තෝරා ගැනීම ඒ සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්ණායක පදනම් කර ගනිමින් ප්‍රතිලාභී කමිටුවක් හරහා සිදු කරයි. මෙම ප්‍රතිලාභ කමිටුව අරමුදලේ සාමාන්‍යාධිකාරී, රේකීය අමාත්‍යාංශයේ නීති අංශයේ නිලධාරී වරයෙකු, වෘත්තීය රෝග විශේෂඥ වෛද්‍ය වරයකු යන අයගෙන් සමන්විත වේ. නිවැරදි ක්‍රමවේදයකට අනුව ප්‍රතිලාභීන් තෝරා ගැනීමට මෙම කමිටුව උපකාරී වේ.

ප්‍රගති සමාලෝචන කමිටුව

ශ්‍රම වාසනා අරමුදලේ ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පිහිටුවන ලද කමිටුවකි. ශ්‍රම වාසනා අරමුදලේ දෛනිකව සිදුවන කටයුතු සොයාබැලීම ප්‍රධාන කාර්යය වේ.මෙම කමිටුව අරමුදලේ කළමනාකරු, ගණකාධිකාරී සහ සහකාර කළමනාකරු යන තිදෙනාගෙන් සමන්විත වන අතර, විශේෂයෙන් එදිනෙදා සිදුකරන කටයුතු, නිම කරන ලද ලිපිගොනු සකස්කිරීම, සැලසුම් කරන ලද වැඩ හා සත්‍ය ලෙස සිදු වී ඇති තත්වයන් පිලිබඳ සොයාබලා වැරදි හා අඩුපාඩු මගහරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම මෙම කමිටුව විසින් සිදු කරයි. අරමුදලේ ලිපිගොනු අඩුපාඩුවලින් තොරව පවත්වා ගෙන යාමට හා වැඩසටහන් ක්‍රමවත්ව සිදුකිරීමට මෙම කමිටුව පිටිවහලක් වී ඇත.

විගණන හා කළමනාකරණ කමිටු තීරණ

පළමු කාර්තුවට අදාල විගණන හා කළමණාකරණ කමිටුවේදී සාකච්ඡා කරන ලද කරුණු හා ගන්නා ලද ක්‍රියා මාර්ග තීරණ

අනු අංකය	සාකච්ඡා කරන ලද කරුණ	තීරණය	ගන්නා ලද ක්‍රියා මාර්ග
01	ලොතරැයි ආදායම්	ලොතරැයි ආදායමෙන් 10%ක් ලොතරැයි මණ්ඩලය ශ්‍රම වාසනා අරමුදලට ලබා දෙන බවත් මේ සම්බන්ධයෙන් නීතිමය තත්ත්වයක් නොමැති බවත් සාමාන්‍යාධිකාරී ප්‍රකාශ කරන ලදී. ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලයට ලොතරැයි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී සාමාජිකයකු ලෙස සහභාගී වන නිසා එහිදී මේ පිළිබඳව සාකච්ඡා කර වැඩි දුරටත් කටයුතු කිරීමට හැකි වන බව සාමාන්‍යාධිකාරී ප්‍රකාශ කරන ලදී.	අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ලොතරැයි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී පත් කර ගන්නා ලදී. මේ වන විට ලොතරැයි ආදායම් වැඩි කර ගැනීම සඳහා සතියට ලොතරැයි වාර 2 ක් ලබා ගැනීමට කටයුතු කරන ලදී.
02	මූල්‍ය ප්‍රකාශන	මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන තෙක් ඒවා වෙනස් කිරීමේ හැකියාව ඇති නිසා අවශ්‍ය සංශෝධනයන් ඇත්නම් ඒවා තවදුරටත් සංශෝධනය කළ හැකි බව ප්‍රධාන මූල්‍ය අධිකාරී ප්‍රකාශ කරන ලදී.	මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත නියමිත දිනයේදී ඉදිරිපත් කර ඇත.
03	අභ්‍යන්තර විගණක සැලැස්ම-2020	ශ්‍රම වාසනා අරමුදලේ අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරන ලද 2020 අභ්‍යන්තර විගණක සැලැස්ම සාකච්ඡා කරන ලදී. එහිදී ගිණුම් පරීක්ෂාව ද අභ්‍යන්තර විගණක සැලැස්ම තුලට ඇතුලත් කරන ලෙස භාණ්ඩාගාරයේ නියෝජිතවරිය විසින් ප්‍රකාශ කරන ලදී.	අභ්‍යන්තර විගණක විසින් ශ්‍රම වාසනා අරමුදලේ අභ්‍යන්තර විගණන සැලැස්ම තුළ ගිණුම් පරීක්ෂාවද ඇතුළත් කර මේ වන විට සකස් කර අවසන් කොට ඇත.

04	තිරසර සංවර්ධන වැඩසටහන	තිරසර න්‍යාය වැඩසටහන, මානව සම්පත් සංවර්ධන සැලැස්ම, තොරතුරු දැනගැනීමේ පනත, පුරවැසි ප්‍රඥාප්තිය යන කරුණු සම්බන්ධයෙන් අදාළ චක්‍රලේඛ පරීක්ෂා කර බලා ඒවා ශ්‍රම වාසනා අරමුදලට අදාළ වන්නේ නම් ඒ අනුව කටයුතු කල යුතු බව අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ප්‍රකාශ කරන ලදී.	තිරසර න්‍යාය වැඩසටහන, මානව සම්පත් සංවර්ධන සැලැස්ම, තොරතුරු දැන ගැනීමේ පනත, පුරවැසි ප්‍රඥාප්තිය මේ වන විට සකස් කර ඇත.

දෙවන කාර්තුවට අදාල විගණන හා කළමණාකරණ කමිටුවේදී සාකච්ඡා කරන ලද කරුණු හා ගන්නා ලද ක්‍රියා මාර්ග තීරණ

අනු අංකය	සාකච්ඡා කරන ලද කරුණ	තීරණය	ගන්නා ලද ක්‍රියා මාර්ග
01	2020 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම	මෙම වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අදියර තුනක් යටතේ ක්‍රියාත්මක කිරීමටත් එය ලැබෙන ආදායමට අනුව වෙනස් කර ක්‍රියාත්මක කිරීමටත් උපදෙස් ලැබී ඇති බව සාමාන්‍යාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී.	වර්තමානයේ ඇති වී තිබෙන කොරෝනා ව්‍යාප්තිය නිසා අරමුදලට ලැබෙන ආදායම අනුව ඉදිරි වැඩසටහන් සැලසුම් සකස් කර ඇත.
02	ශිෂ්‍යත්ව වැඩසටහන	වර්ෂය සඳහා ශිෂ්‍යත්ව 100 සැලසුම් කර ඇති බවත්, පළමු අදියර යටතේ මින් ශිෂ්‍යත්ව 50 ක් ලබා දීමට සැලසුම් කර ඇති බව ප්‍රකාශ කරන ලදී.	මෙම ශිෂ්‍යත්ව මේ වන විට ලබා දී අවසන් කොට ඇත.
03	ශ්‍රම වාසනා අරමුදල ක්‍රියාකාරී සැලැස්ම	යාවත්කාලීන කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.	ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කොට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇත.
04	ලොතරැයි ගිවිසුම	පනතට අනුව ලොතරැයි ආදායමෙන් 10% ක් ලැබිය යුතු බවත් ඒ සඳහා ගිවිසුමක් තිබිය යුතු බව විගණන අධිකාරී ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව ලොතරැයි මණ්ඩලය ප්‍රකාශකර සිටිනුයේ එම ගිවිසුම භාණ්ඩාගාරය සමඟ ඇති කර ගත යුතු බවයි. මෙය ගැටලුවක් බව විගණන අධිකාරී තව දුරටත් ප්‍රකාශ කරන ලදී.	මේ පිළිබඳ භාණ්ඩාගාරය වෙත ලිපියක් යවා නැවත සිහි කැඳවීම් ලිපිද යවා ඇත.

05	සිදු කරනු ලැබූ වැඩ සටහන් වලට අදාල ලියකියවිලි යාවත්කාලීන කිරීම.	ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් වලට අදාළ වියදම් වලට අදාළ ලියකියවිලි ඒ අවස්ථා වලදීම යාවත්කාලීන නොවන බව විගණන අධිකාරී විමසන ලදී. මේ සඳහා ප්‍රගති සමාලෝචන කමිටුවක් පත් කර ඇති බවත් එහි නිර්දේශයන්ට අනුව කටයුතු කරන බව සාමාන්‍යාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී.	මේ පිළිබඳ කාර්යය මණ්ඩලයේ අවධානය යොමු කිරීම සඳහා ප්‍රගති සමාලෝචන කමිටුව මඟින් යාන්ත්‍රණයක් සකස් කොට ඇත.
06	භාණ්ඩ සමීක්ෂණ කටයුතු ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම	භාණ්ඩ සමීක්ෂණ කටයුතු ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කිරීම පිළිබඳව ප්‍රධාන මූල්‍ය අධිකාරී විමසන ලදී.	භාණ්ඩ සමීක්ෂණ කටයුතු ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කොට ඇත.

තෙවන කාර්තුවට අදාල විගණන හා කළමණාකරණ කමිටුවේදී සාකච්ඡා කරන ලද කරුණු හා ගන්නා ලද ක්‍රියා මාර්ග තීරණ

අනු අංකය	සාකච්ඡා කරන ලද කරුණ	තීරණය	ගන්නා ලද ක්‍රියා මාර්ග
01	ශ්‍රම වාසනා අරමුදල් පනත	ශ්‍රම වාසනා අරමුදල 2187/27 දරණ 2020.08.09 වන දින නිකුත් කරන ලද ගැසට් පත්‍රය තුල ක්‍රියාත්මක කල යුතු අණපනත් යටතේ කම්කරු අමාත්‍යාංශය තුලත් මුදල් අමාත්‍යාංශය යටතේත් දක්වා තිබීම නිසා ඒ පිළිබඳ විගණන හා කළමණාකරණ කමිටුව දැනුවත් කරන ලදී. එසේ තිබීම නිසා ආයතනය කෙසේ පවත්වා ගත යුතුද යන්න පිළිබඳ ලිඛිත උපදෙස් ලබා ගැනීම ඉදිරියේදී ඇතිවන ගැටළු මග හැරීමට හේතු වන බව විගණන අධිකාරී ප්‍රකාශ කරන ලදී. ඒ සම්බන්ධව මුදල් අමාත්‍යාංශයෙන් ලිඛිත පැහැදිලි කිරීමක් ලබා ගන්නා ලෙස කමිටුව විසින් ප්‍රකාශ කරන ලදී.	විගණන හා කළමණාකරණ කමිටුවේ උපදෙස් අනුව අර්ථ දැක්වීමක් ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයට යැවූ අතර මේ පිළිබඳ සිහි කැඳවීම් ලිපි යවා ඇත.

02	අභ්‍යන්තර විගණන වාර්තා	ශ්‍රම වාසනා අරමුදලේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණන විමසුම් නිකුත් කර ඇති දැයි කමිටුව විසින් විමසන ලදී. ඒ වන විට අරමුදල සඳහා අභ්‍යන්තර විගණක වරයෙක් පත් කර නොසිටි බව සාමාන්‍යාධිකාරී විසින් ප්‍රකාශ කරන ලදී.	මේ වන විට අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ඒවා ඇත.
03	2019 වර්ෂයේ විගණකාධිපති වාර්තාව - ප්‍රතිපෝෂණයන් ලබා ගැනීම	ශ්‍රම වාසනා අරමුදල සුභසාධන ආයතනයක් බැවින් අරමුදල විසින් සිදු කරනු ලබන කාර්යයන් ප්‍රතිලාභීන්ට නිසි පරිදි ලැබෙන්නේද යන්න සහ ප්‍රතිපෝශණයන් ලබා ගැනීම පිළිබඳව විගණන අධිකාරී විසින් විමසන ලදී. මේ වන විට ශ්‍රම වාසනා අරමුදලේ සියලුම වැඩසටහන් අරමුදලේ වෙබ් අඩවිය තුලට ඇතුලත් කර ඇති බවත් එමගින් ලබා ගන්නා ප්‍රතිලාභීන් හට මාස 03 මාස 12කට වරක් ප්‍රතිපෝෂණ පත්‍රිකා යවා ඔවුන්ගේ ප්‍රතිපෝෂණයන් වෙබ් අඩවිය තුලට ඇතුලත් කරන බව සාමාන්‍යාධිකාරී විසින් පවසන ලදී. මේ සම්බන්ධව වෙබ් අඩවිය මගින් ඇස් කණ්නාඩි ලබා දීමේ වැඩසටහන උදාහරණයට ගනිමින් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. මීළඟ රැස්වීමේදී සියලු වැඩසටහන් තොරතුරු පද්ධතිය භාවිතයෙන් සිදු කරන ආකාරය පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කරන බව සාමාන්‍යාධිකාරී ප්‍රකාශ කරන ලදී.	වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සොයා බැලීමට මාස 03, මාස 06, මාස 12 කට සැරයක් ප්‍රතිපෝෂණ යැවීමේ ක්‍රමවේදයක් වෙබ් අඩවිය හරහා සිදු කරමින් පවතී.
04	ශ්‍රම වාසනා අරමුදල සඳහා ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීම	ශ්‍රම වාසනා අරමුදල ස්ථානගත වීම සඳහා මුදල් අමාත්‍යාංශයට ලබා දී ඇති මෙහෙවර පියස ගොඩනැගිල්ලේ මහල් පිළිබඳව මුදල් අමාත්‍යාංශයෙන් විමසා සිටින ලෙස කමිටුව විසින් සාමාන්‍යාධිකාරී වෙත දැනුම් දෙන ලදී.	ශ්‍රම වාසනා අරමුදලේ කාර්යාලය සඳහා වැඩි ඉඩකඩක් ලබා ගැනීමට මේ වන විට කරුණු සාකච්ඡා කරමින් පවතී.

විශ්ලේෂණාත්මක වාර්තාව - (2016 - 2020)

01. ආදායම

- 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතින් ස්ථාපිත කරන ලද ශ්‍රම වාසනා අරමුදල සේවා නියුක්තයන්ගේ සුභසාධනය උදෙසා පිහිටුවා ඇති ආයතනයකි. ආයතනය මඟින් සිදු කරනු ලබන සුභසාධන කටයුතු සඳහා ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනුයේ සෙනසුරාදා හා ඉරිදා දිනුම් අදිනු ලබන ජාතික සම්පත ලොතරැයිය මඟින් වේ.

- "ශ්‍රම වාසනා" නමින් වෙළඳපොලට නිකුත් කල ලොතරැයිය 2010 වසරේදි "ජාතික සම්පත" ලෙස නාමය වෙනස් කරන ලදී. එහිදි 2010 වර්ෂ අවසානයේ මිලියන 28 ක් ව පැවති ලොතරැයි ආදායම විවිධ උපක්‍රම භාවිතයෙන් ක්‍රමක්‍රමයෙන් 2013 වර්ෂය අවසානයේ මිලියන 63 දක්වා වැඩි කර ගැනීමට හැකි විය.

- 2016 වර්ෂයේ ශ්‍රම වාසනා අරමුදල මඟින් ජාතික සම්පත විශේෂ දිනුම් ඇදීමේ වාරයක් පවත්වන ලදී. එයින් 2016 වර්ෂය අවසානයේ ආදායම මිලියන 65 ක් දක්වා වැඩි විය.

- 2016 වර්ෂය දෙසැම්බර් මාසයේ ලොතරැයි පතක මිල රු.20 සිට රු.30 දක්වා වැඩි විය. එය නැවතත් 2017 ජනවාරි මස මිල රු.30 සිට රු.20 දක්වා අඩු කිරීම සිදු කලත්, එයින් ලොතරැයි අලෙවියට සිදු වූ හානිය අවම වීමට මාස කිහිපයක් ගත විය. එබැවින් 2017 වර්ෂය අවසන් වන විට ආදායම මිලියන 46 දක්වා අඩු විය.

- 2017 වර්ෂය අවසානයේ මිලියන 46 ක්ව පැවති ආදායම ක්‍රමක්‍රමයෙන් 2018 වර්ෂයේ මිලියන 51 දක්වා වැඩිවිය. ඉන් අනතුරුව 2019 වර්ෂයේ පාස්කු ප්‍රහාරයත් සමඟ මාස කිහිපයක් ලොතරැයි ආදායම අඩු විය.

- 2019 වසරේ ශ්‍රම වාසනා අරමුදල් පනත සංශෝධනය කල අතර එයින් සේවා නියුක්තයන්ට මෙන්ම ඔවුන්ගේ යැපෙන්නන් සඳහාද ප්‍රතිලාභ ලබා දීම සිදු කල හැකි වීම, ජාතික ලොතරැයි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා හා කම්කරු කොමසාරිස් ජනරාල්වරයා නිල බලයෙන් ශ්‍රම වාසනා අරමුදලහි සාමාජිකයන් වූ බැවින් අරමුදලහි ස්ථාවරභාවය තවත් ශක්තිමත් විය. එම වසර අවසානයේ ලොතරැයි ආදායම මිලියන 60 ක් දක්වා වැඩි විය.

- 2020 වර්ෂයේ පෙබරවාරි මාසය වන තෙක් ලොතරැයි ආදායමහි වර්ධනයක් පැවති අතර, එම වසර අවසාන වන විට මිලියන 30 දක්වා අඩු විමට කොරෝනා ව්‍යසනය හේතුවිය.



ප්‍රස්ථාරය - 01

02. වැඩසටහන්

- 2016 වර්ෂයේ ලොතරැයි ආදායම මිලියන 65 (95%) පමණ පැවති අතර අක්ෂී සායන, පාසල් උපකරණ බෙදා දීම හා ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීම් ආදිය සඳහා වැඩි අවදානයක් යොමු කර සිදු කර ඇත

- 2017 වර්ෂයේ ලොතරැයි ආදායම මිලියන 46 (79%) පමණ පැවති අතර, සහ සාධන වැඩසටහන් යටතේ අයෝජන කලාප වල ක්‍රීඩා පහසුකම්, සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම, ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ පැවැත්වීම, පාසල් උපකරණ බෙදා දීම, හා සවිබල ගැන්වීමේ වැඩසටහන් ආදිය සඳහා වැඩි අවධානයක් යොමු කර සිදු කරන ලදී.

- 2018 වර්ෂයේ ලොතරැයි ආදායම මිලියන 51 (81.86%) පමණ පැවති අතර අක්ෂී සායන හා සුභසාධන වැඩසටහන් යටතේ පාසල් උපකරණ බෙදා දීම, ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ පැවැත්වීම ආදීය සිදු කරන ලදී.

- ශ්‍රම වාසනා අරමුදලේ මෙතෙක් වැඩිම වැඩසටහන් ප්‍රමාණයක් සිදු කල වර්ෂය ලෙස 2019 වර්ෂය සැලකිය හැකිය. ඒ අතර අක්ෂී සායන, සවිබල ගැන්වීමේ වැඩසටහන්, පාසල් උපකරණ බෙදා දීම, ජංගම සේවා පැවැත්වීම, හා ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ පැවැත්වීම ආදීය සිදු කර ඇත.

- 2020 වර්ෂයේ මුල් කාර්තුවේ සවිබල ගැන්වීමේ වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් සිදු කිරීමට හැකි වූ අතර, ඉන් අනතුරුව කොරෝනා වසංගත තත්වය හේතුවෙන් වැඩසටහන් ආදිය සිදු කිරීම අපහසු වන ලදී. නමුත් කොරෝනා වසංගත තත්වය හේතුවෙන් රැකියා අහිමි වූ පිරිස් වෙත නීති ආධාර ලබා දීම වැඩි වීමක් සිදු වී ඇත. ඊට අමතරව මරණීය අනතුරු ශිෂ්‍යත්ව ලබා දීමේ වැඩි වීමක් සිදු වී ඇත.

දැනුවත් කිරීමේ වැඩසටහන්
(රුපියල්)



ප්‍රස්ථාරය - 02

සවිබලගැන්වීමේ වැඩසටහන්
(රුපියල්)



ප්‍රස්ථාරය - 03

වෛද්‍ය කඳවුරු වැඩසටහන්
(රුපියල්)



ප්‍රස්ථාරය - 04

නීති ආධාර වැඩසටහන්
(රුපියල්)



ප්‍රස්ථාරය - 05

මරණීය අණතුරු ශිෂ්‍යත්ව වැඩසටහන්
(රුපියල්)



ප්‍රස්ථාරය - 06

සුභසාධන වැඩසටහන්
(රුපියල්)



ප්‍රස්ථාරය - 07

03. ඵලදායිතාවය හා ප්‍රවණතාවන්

- ශ්‍රම වාසනා අරමුදල 2016 වර්ෂයේ වෙබ් පාදක තොරතුරු පද්ධතියක් අදියර 3ක් යටතේ සකස් කරන ලදී. ඒ යටතේ ශ්‍රම වාසනා අරමුදල මඟින් සිදු කරනු ලබන වැඩසටහන්හි දත්ත මෙම පද්ධතියට ඇතුලත් කරනු ලැබේ. තවද එම ප්‍රතිලාභීන් පසු විපරම් කිරීමටත්, ඔවුන් සඳහා අදාල සේවාවන් ලැබී ඇත්ද යන්න ආදිය සොයා බැලිය හැකි වීමත්, SMS Notification සේවාව මඟින් ප්‍රතිලාභීන් දැනුවත් කිරීම් ආදිය සිදු කල හැකි වීම නිසා ඉහත කාර්යයන් සඳහා කඩදාසි මුද්‍රණය අවම වීම, අවම කාලයක් තුල සේවාව ලබා දිය හැකි වීම ආදිය වාසිදායක වේ.

- 2016 වර්ෂයේ ISO 9001 : 2015 තත්ව සහතිකය සඳහා අයදුම් කර සහතිකය ලබා ගන්නා ලදී. එහිදි ශ්‍රම වාසනා අරමුදල මඟින් සපයනු ලබන සේවාවන්ට අදාල අයදුම්පත්‍ර හා අනෙකුත් සියලුම ලිපි ලේඛන විධිමත් කිරීමත්, එමඟින් ප්‍රතිලාභීන් සඳහා සපයනු ලබන සේවාවන් පහසුවෙන් සැපයීය හැකි වීමත් වාසි දායක විය.

- 2020 වර්ෂයේ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් පවත්වනු ලබන ඵලදායිතා සම්මානය සඳහා අයදුම් කර (Complimentary Certificate) ප්‍රශංසනාත්මක සහතිකයක් හිමි විය. එමඟින් ආයතනය වෙත මෙන්ම ආයතනයහි සේවය කරනු ලබන සේවකයන්ටද ප්‍රතිලාභ හිමි විය.

04. ප්‍රචාරණය හා ප්‍රවර්ධනය

- ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වනුයේ ජාතික සම්පත ලොතරැයිය වේ. ශ්‍රම වාසනා අරමුදල හා ජාතික සම්පත ලොතරැයිය පිළිබඳ ප්‍රචාරණය කරනු පිණිස ශ්‍රම වාසනා ලාංඡනය සහිත කුඩා අත්පත්‍රිකා, කී ටැග්, හිස් වැසුම්, ටී ෂර්ට් ආදිය මුද්‍රණය කර ශ්‍රම වාසනා අරමුදල මඟින් සිදු කරනු ලබන වැඩසටහන් තුලදි ලොතරැයි අලෙවියට සමගාමීව බෙදා හැරීම පසුගිය වර්ෂ වලදි සිදු කරන ලදී.

- ශ්‍රම වාසනා අරමුදලහි අරමුණු වලට අදාලව සේවා ලාභීන් දැනුවත් කිරීම සඳහා 2016, 2017, 2018 වර්ෂ වලදී පුවත්පත් දැන්වීම්, මාධ්‍ය සාකච්ඡා ආදීය මඟින් ප්‍රචාරණය සිදු කරනු ලද අතර, වර්ථමානයේ එය ෆෙස්බුක් (Facebook), යූටියුබ් (Youtube) ආදී ඩිජිටල් තාක්ෂණය යොදා ගෙන සිදු කරමින් පවති. එමඟින් වියදම් අඩු හා වැඩි ප්‍රචාරණයක් ලබා දීමට හැකි වනු ඇත.

- ශ්‍රම වාසනා අරමුදල නමින් ෆෙස්බුක් (Facebook), යූටියුබ් (Youtube) ගිණුම් 2ක් ඇති අතර එමඟින් ශ්‍රම වාසනා අරමුදල පිළිබඳව හා එමඟින් සිදු කරනු ලබන සේවාවන් පිළිබඳව ශ්‍රව්‍ය දෘශ්‍ය මාද්‍ය මඟින් දැනුවත් කිරීම අඛණ්ඩව සිදු කරයි.

මූල්‍ය කාර්යසාධන සමාලෝචනය

ශ්‍රම වාසනා අරමුදල සඳහා ලැබීම්

(අ) පාර්ලිමේන්තුව විසින් අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමේ කාර්යය සඳහා කලින් කළ සම්මත කරනු ලැබිය හැකි සියළු මුදල්.

(ආ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ප්‍රධාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළුම මුදල්.

(ඇ) අරමුදල මඟින් කරන ආයෝජන වලින් ආදායම වශයෙන් ලැබෙන මුදල්.

(ඈ) 13 වන වගන්තියේ සඳහන් ලොතරැයි වලින් ලැබෙන මුදල් ද ඇතුළුව මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදි සහ කර්තව්‍ය ඉටු කිරීමේදි අරමුදල ලැබෙන සියළුම මුදල්.

ශ්‍රම වාසනා අරමුදල පෞද්ගලික අංශයේ සේවකයන් ආවරණය වන පරිදි පිහිටුවා ඇති අතර ස්වයං රැකියා කරනු ලබන පිරිස මෙමඟින් ආවරණය නොවේ. ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ධාරිතාව මත විවිධ වැඩසටහන් එක් එක් සීමාවන් තුල ක්‍රියාත්මක කරනු ලැබේ. මූල්‍ය ධාරිතාව වැඩිවීමත් සමඟ එම සීමා වලින් ඔබ්බට තව දුරටත්සේවාවන් පුළුල් කිරීම වසරින් වසර සිදු කරමින් පවතී.

මුලු වියදම (රුපියල්)

	2016	2017	2018	2019	2020
පරිපාලන වියදම්	8,952,149	12,609,705	13,931,486	15,849,845	14,731,837
අරමුණුගත වියදම්	30,267,660	30,178,504	28,071,637	32,556,007	8,131,554

වගුව - 01



ප්‍රස්ථාරය - 08

මුලු වත්කම් හා වගකීම් (රුපියල්)

	2016	2017	2018	2019	2020
මුළු වත්කම්	399,511,275	420,048,160	431,441,874	455,077,472	468,049,378
මුළු වගකීම්	1,307,232	8,688,538	2,505,508	2,081,149	2,731,479

වගුව - 02



ප්‍රස්ථාරය - 09

ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් (රුපියල්)

	2016	2017	2018	2019	2020
ජංගම වත්කම්	334,144,880	302,306,476	417,604,915	439,140,324	452,938,752
ජංගම නොවන වත්කම්	65,366,394	117,741,684	13,836,958	15,937,138	15,110,626

වගුව - 03



ප්‍රස්ථාරය - 10

ශ්‍රම වාසනා අරමුදලේ 1998 - 2020 විශේෂ අවස්ථා

1998 මාර්තු 31 වන දින ශ්‍රම වසනා අරමුදල ආරම්භ කල අතර සාමාන්‍යාධිකාරී හා කාර්යය මණ්ඩලයේ තිදෙනෙකු ගෙන් සැදුම් ලත් ඉතා අඩු කාර්යය මණ්ඩලයක් මගින් සියලු කටයුතු කරගෙන යන ලදී. මෙසේ 2010 වසර පමණ වන තෙක් ඉතාම අඩු පහසුකම් මත බොහෝ දුෂ්කරතා මධ්‍යයේ අරමුදලේ කටයුතු සිදුකරන ලදී.

2010 වසරේ සිට අරමුදලේ සේවාවන් පෙරට වඩා මුළු දිවයිනම ආවරණය වන ලෙස පවත්වාගෙන යාම අරමුණු කර නව කාර්යය මණ්ඩලය බඳවා ගැනීම, අරමුදලට අවශ්‍ය සම්පත් මිලදී ගැනීම, සේවක පුහුණුව හා සංවර්ධන වැඩසටහන් පවත්වා ඔවුන් යාවත්කාලීන කිරීම නිරන්තර ව සිදු කරන ලදී, මුලින් තිබූ "ශ්‍රම වාසනා ක්ෂණික" ලොතරැයිය "ජාතික සම්පත-සෙනසුරාදා" ලෙස දිනුම් අදිනු ලබන ලොතරැයියක් ලෙස වෙනස් කිරීම හා ලොතරැයි ප්‍රවර්ධන කටයුතු පුළුල් කිරීම තුලින් ලොතරැයි අලෙවිය වැඩිවීම මත අරමුදලේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ ප්‍රතිශතය ඉහල යන ලදී.

අරමුදල හා එහි කාර්යයන් ප්‍රතිලාභීන් අතරට රැගෙන යාම සඳහා දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා කම්කරු ඉංජිනේරු කාර්යාල හා එක්ව කටයුතු කල අතර, අරමුදලේ කාර්යන් ඇතුලත් දැන්වීම් ලංකාවේ සියලුම කම්කරු විනිශ්චය සභා, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රදර්ශනය කරන ලද අතර මේ තුලින් අරමුදල පිලිබඳ ජනතාව දැනුවත් වූ අතර එය ලොතරැයි අලෙවිය වැඩිවීමට ද හේතු විය.

අරමුදලේ අරමුණු වලට අනුව කටයුතු සිදුකරන අතර වඩාත් ඵලදායි ලෙස සේවා සැපයීම අරමුණු කර අමාත්‍යාංශය යටතේ පැවති ආයතන අතුරින් ආයතනයක් හිමිකරගත් පළමු ISO ජාත්‍යන්තර තත්ත්ව සහතිකය 2016 වසරේ ශ්‍රම වාසනා අරමුදල හිමි කරගන්නා ලදී.

ආයතනික කටයුතු පුළුල් කරමින් බොහෝ කාර්යයන් පහසුවෙන් හා කඩිනමින් සිදුකර ගැනීම සඳහා පරිගණක ගත ක්‍රමවේද අනුගමනය කරමින් මාර්ග ගත (Online System) ක්‍රමයට නිලධාරීන්ට තම රාජකාරී සිදු කිරීමටත්, ප්‍රතිලාභීන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමටත් අවශ්‍ය පරිගණක ගත වැඩ පරිසරයක් (Computer Base Working Environment) ශ්‍රම වාසනා අරමුදල තුළ ස්ථාපනය කර ඇත. එසේම Digital Recording System භාවිතා කරමින් ඉතා කඩිනමින් ප්‍රතිලාභීන්ට තොරතුරු ලබාදීමද දැනටමත් සිදු කරයි.

ඉදිරි වසර තුල ජාතික ඵලදායිතා තරගාවලියට ඉදිරිපත් වීමට සහ 5-S සංකල්පය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ තුලින් අරමුදලේ කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායිව සිදුකිරීම අරමුණ වේ.

ශ්‍රම වාසනා අරමුදලේ ඩිජිටල් තොරතුරු පද්ධතිය



රූපසටහන - 01

ශ්‍රම වාසනා අරමුදල ISO තත්ව සහතිකය ලබා ගැනීම


TÜV NORD

CERTIFICATE

Management system as per
ISO 9001 : 2015

In accordance with TÜV NORD CERT procedures, it is hereby certified that

SHRAMA VASANA FUND
Ministry of Foreign Relations,
Skills Development & Employment and Labour Relations,
97, Jawatta, Colombo - 00500,
Sri Lanka

applies a management system in line with the above standard for the following scope

Provision of Resources for the Welfare of Sri Lankan Labour Force and their related Parties

Certificate Registration No.**44 100 20392795**
Audit Report No.**2.5-9718/2020**
Valid from **13.02.2020**
Valid until **12.02.2023**

Certification Body
at TÜV NORD CERT GmbH
Mumbai, **13.02.2020**

This certification was conducted in accordance with the TÜV NORD CERT auditing and certification procedures and is subject to regular surveillance audits.

TÜV NORD CERT GmbH Langemarckstrasse 20 45141 Essen www.tuev-nord-cert.com

TUV India Pvt. Ltd., 801, Raheja Plaza – 1, L.B.S. Marg, Ghatkopar (W), Mumbai - 400 086, India www.tuv-nord.com/in

IAF DAkkS Deutsche Akkreditierungsstelle D-ZM-12007-01-00

රූපසටහන - 02

ශ්‍රම වාසනා අරමුදලේ කාර්යසාධනය 2020

2020 වසර ආරම්භයත් සමග ලෝකයට බලපාන ලද කොවිඩ් 19 වසංගතයේ බලපෑම ශ්‍රී ලංකාවට ද බලපෑම් එල්ල කළේය. මෙම වසංගත තත්වය හමුවේ 2020 වසර වෙනුවෙන් ශ්‍රම වාසනා අරමුදල සැලසුම් කරන ලද කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමින් ඉටු කර ගැනීමට නොහැකි විය.

විශේෂයෙන් රටතුල සංචරණ සීමා පැනවීම, යම් යම් ප්‍රදේශ තාවකාලිකව වසා දැමීම, සේවා වාර ක්‍රමයන් ට අනුගත වෙමින් අත්‍යවශ්‍ය රාජකාරී පමණක් සිදු කිරීම වැනි හේතු මෙයට බලපාන ලදී.

තවද ශ්‍රම වසනා අරමුදලේ බොහෝ වැඩසටහන් ආයතනයෙන් බැහැර කර්මාන්තශාලා, වැඩබිම්, ඉලක්කකර වීම පරිශ්‍රයන් වෙත ගොස් සිදුකරන පසුබිමක සංචරණ සීමා හා වීම ආයතනවල ආරක්ෂාව වැනි හේතූන් නිසා කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමින් ඉටු කිරීමට නොහැකි විය.

එසේම ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආධායම් මාර්ගය වන ලොතරැයි ආධායම අඩුවීම හේතුවෙන් වාර්ෂිකව ලැබෙන ආධායම සීග්‍රයෙන් පහත වැටුණි. මේ නිසා 2020 වසරට සැලසුම් කරන ලද වැඩසටහන් ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි සංශෝධනය කර සිදු කිරීමට තීරණය කරන ලදී.

මෙවැනි තත්වයන් මධ්‍යයේ 2020 වසර තුල මේ දක්වා ශ්‍රම වාසනා අරමුදල විසින් සිදුකරන ලද වැඩසටහන් පහත දක්වා ඇත.

01. දැනුවත් කිරීමේ වැඩසටහන්

දළ විශ්ලේෂණය

ශ්‍රම වාසනා අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ අතර සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම ප්‍රමුඛ වේ. පසුගිය වසර කහිපය දෙස බලන විට ලංකාවේ සිදුවන කාර්මික අනතුරු වලින් බොහෝ ප්‍රමාණයක් සේවක සේවිකාවන්ගේ නොසැලකිලිමත් බව, ආරක්ෂක උපකරණ භාවිතයට නැඹුරු නොවීම වැනි හේතු තුලින් සිදු වී ඇති බව පැහැදිලි විය.

මෙම හේතු නිසා අනතුරු වැලැක්වීමේ පූර්ව සූදානමක් ලෙස පසුගිය වසර වල අනතුරු වාර්තා වී ඇති හා අවදානම් තත්වයන් ඇති කර්මාන්තශාලා හඳුනාගෙන ආරක්ෂිතව වැඩ කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ඒ පිළිබඳව දැනුමක් ඇති ඉංජිනේරුවරුන් මාර්ගයෙන් සිඳුකරන ලදී.

එසේම කම්කරු නීති අණපණත් පිළිබඳව සේවක සේවිකාවන් මෙන්ම ආයතන හිමිකරුවන්ට පැන නගින ගැටළුකාරී තත්වයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් ක්ෂේත්‍රෙය් පළපුරුදු සම්පත් දායකවරුන් මාර්ගයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලදී.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් ඉතා සාර්ථක වූ අතර කම්කරු නීති අනපණත් පිළිබඳ සේවක සේවිකාවන් හා සේවය ප්‍රජාව දැනුවත් වූ අතර වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් කාර්මික අනතුරු අවම කිරීමටත් හැකියාව ඇති විය.



සිතියම - 01













ඡායාරූප: ශ්‍රම වාසනා අරමුදල විසින් පවත්වනු ලැබූ දැනුවත්කිරීමේ වැඩසටහන් අවස්ථාවන්

02. මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන

දළ විශ්ලේෂණය

ශ්‍රී ලංකාව තුළ කර්මාන්තශාලා වල සිඳුවන අනතුරු වලින් මියගිය හෝ පූර්ණ බෙලහීන තත්වයට පත් කම්කරු ජනතාවගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

යම් කර්මාන්තශාලාවක, වැඩබිමක හෝ සේවා ස්ථානයක සිදු වන කාර්මික අනතුරු පිළිබඳ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් මාර්ගයෙන් ලබාගන්නා තොරතුරු හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හරහා ලබා ගන්නා තොරතුරු පදනම් කර ගෙන ප්‍රතිලාභීන් හඳුනා ගන්නා අතර මියගිය හෝ පූර්ණ බෙලහීන තත්ත්වයට පත් වන සේවක සේවිකාවන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් (පෙර පාසල් අධ්‍යාපනයේ සිට විශ්ව විද්‍යාල හෝ උසස් අධ්‍යාපනය දක්වා එනම්, වයස 3-25) දරුවන් මේ සඳහා සුදුසුකම් ලබන අතර, එවැනි දරුවන් වෙනුවෙන් රු.50,000/= ස්ථාවර තැන්පතුවක් හා අධ්‍යාපන උපකරණ ලබා දීම කරනු ලබයි.

පැවති වසංගත තත්වය හේතුවෙන් මෙම වසරේ මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන 2020 ජූනි මස 06,08,09 හා 10 දිනවල මාතර, හම්බන්තොට, කළුතර, ගම්පහ, කුරුණෑගල, මහනුවර, කෑගල්ල, නුවරඑළිය, බදුල්ල, හා රත්නපුර, යන ප්‍රාදේශීය කම්කරු කාර්යාල වල දී සිදු කරන ලදී.



සිතියම - 02

















ඡායාරූප: ශ්‍රම වාසනා අරමුදල විසින් පවත්වනු ලැබූ මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන් අවස්ථාවන්

02. සවිබල ගැන්වීමේ වැඩසටහන්

දළ විශ්ලේෂණය

ශ්‍රමික පවුල් සවිබල ගැන්වීමේ අරමුණින් සිඳුකරන ලබන මෙම වැඩසටහන් විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී කම්කරු පවුල් සවිබල ගැන්වීම අරමුණ කරගෙන සිදුකරයි. වසරින් වසර ලංකාවේ එක් එක් පළාත් ආවරණය වන ආකාරයට ලංකාවම ආවරණය වන පරිදි මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර කම්කරු පවුල් වල ආර්ථිකය ශක්තිමත් කිරීමට අඩු ආදායම්ලාභී එක් පවුලකින් එක් අයෙකු බැගින් තෝරා ඔවුන් කැමති අංශයකින් හෝ ඔවුනේගේ ප්‍රදේශයට ගැළපෙන අංශයක් යටතේ ස්වයං රැකියා සඳහා පුහුණුවක් ලබා දී එම කර්මාන්ත කරගෙන යාමට අවශ්‍ය උපකරණ කට්ටල ලබා දීම සිදුකරනු ලබයි.



සිතියම - 03

පැවති වසංගත තත්වය හමුවේ 2020 වසර සඳහා කෘත්‍රිම පාද එකක් ලබා දීම සිදු කරන ලද අතර, නීති ආධාර සේවකයින් 24 දෙනෙකු වෙනුවෙන් ද අභියාචනා වෙනුවෙන් ලබාදෙන නීති ආධාර එක අයෙක් වෙනුවෙන් ලබා දීම සිදු කරන ලදී.







ඡායාරූප: ශ්‍රම වාසනා අරමුදල විසින් පවත්වනු ලැබූ සවිබල ගැන්වීමේ වැඩසටහන් අවස්ථාවන්

මූල්‍යමය තොරතුරු

ශ්‍රම වාසනා අරමුදල
2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ව ප්‍රකාශය

		(රුපියල්) 2020	(රුපියල්) 2019
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන වත්කම්	සටහන 03	2,104,691.77	3,802,821.01
තොගය	සටහන 05	1,495,145.07	858,552.69
ස්ථාවර තැම්පතු		113,000,000.00	95,000,000.00
ලැබිය යුතු අයිතම	සටහන 04	336,338,915.56	339,478,950.32
		452,938,752.40	**439,140,324.02**
ජංගම නොවන වත්කම්			
ආයෝජන		2,774,958.00	2,774,958.00
අස්පෘශ්‍ය වත්කම්	සටහන 02	22,850.23	28,850.23
පිරියත, යන්ත්‍ර හා උපකරණ	සටහන 01	12,312,817.53	13,133,340.24
		15,110,625.76	15,937,148.47
මුලු වත්කම්		**468,049,378.16**	**455,077,472.49**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු බිල්පත්	සටහන 07	159,412.88	132,044.57
වෙන් කිරීම්	සටහන 08	1,239,500.00	797,500.00
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		1,332,566.50	1,151,604.00
මුළු වගකීම්		2,731,479.38	2,081,148.57
ශුද්ධ වත්කම්		**465,317,898.78**	**452,996,323.92**
සමුච්ච අතිරික්තය	සටහන 06	461,692,398.78	449,370,823.92
සංචිත			
රාජ්‍ය ප්‍රදාන		3,625,500.00	3,625,500.00
මුලු ශුද්ධ වත්කම්		**465,317,898.78**	**452,996,323.92**

පිටු අංක 32 සිට 41 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, හා ගිණුම්කරණ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය කොටසක් වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAs) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත්කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන අත්සන් කර ඉදිරිපත් කරන ලදී.

සභාපති, ජූඩ් නිලුක්ෂාන්, ශ්‍රම වසනා අරමුදල.	අධ්‍යක්ෂ, බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති, ශ්‍රම වසනා අරමුදල.	සාමාන්‍යාධිකාරී, ඩී.ආර්.ජයලත්, ශ්‍රම වසනා අරමුදල.	ගණකාධිකාරී, එම්.එල්.ජයමාලි, ශ්‍රම වසනා අරමුදල.

ශ්‍රම වාසනා අරමුදල **2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා** **මූල්‍ය කාර්ය සාධන වාර්තාව**			
ආදායම්		(රුපියල්) 2020	(රුපියල්) 2019
ආදායම්	සටහන 10	37,802,624.87	73,246,457.89
මුලු ආදායම්		37,802,624.87	73,246,457.89
වියදම්			
පරිපාලන වියදම්	සටහන 11	14,731,836.98	15,849,845.47
ක්ෂය	සටහන 12	2,054,339.30	1,983,224.05
අරමුණු ගත වියදම්	සටහන 13	8,131,553.92	32,556,007.49
වෙනත් වියදම්	සටහන 14	554,378.00	1,024,642.02
		25,472,108.20	51,413,719.03
වසරේ අතිරික්තය		**12,330,516.67**	**21,832,738.86**

ශ්‍රම වාසනා අරමුදල **2020 දෙසැම්බර් 31 දිනට** **හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**			
		සමුච්චිත අරමුදල (රුපියල්)	**එකතුව** (රුපියල්)
2018.12.31 දිනට ශේෂය		428,530,971.72	428,530,971.72
පසුගිය වසරේ ගැලපීම්		2,632,613.34	2,632,613.34
වාහන අත්පත් කරගැනීම් (KO 7519) රාජ්‍ය ප්‍රදාන	සටහන 15.1	(3,500,000.00)	(3,500,000.00)
ලී බඩු අත්පත් කරගැනීම් - රාජ්‍ය ප්‍රදාන	සටහන 15.1	(125,500.00)	(125,500.00)
වසරේ අතිරික්තය		21,832,738.86	21,832,738.86
2019.12.31 දිනට ශේෂය		449,370,823.92	449,370,823.92
පසුගිය වසරේ ගැලපීම්	සටහන 15	(8,941.81)	(8,941.81)
වසරේ අතිරික්තය		12,330,516.67	12,330,516.67
2020.12.31 දිනට ශේෂය		**461,692,398.78**	**461,692,398.78**

ශ්‍රම වාසනා අරමුදල
2020-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ලැබීම්		(රුපියල්) 2020	(රුපියල්) 2019
වසරේ අතිරික්තය		12,330,516.67	21,832,738.86
ගැලපීම්			
නොගෙවූ සේ.අ. හා සේ.භා. අරමුදල්		-	(585,673.10)
සේ.භා. අරමුදල් අධිභාරය		-	(95,489.28)
		12,330,516.67	**21,151,576.48**
මුදල් නොවන චලනයන්			
ක්ෂය		2,048,339.30	1,973,103.05
ක්‍රමක්ෂය		6,000.00	10,121.00
ආයෝජන ආදායම්		(7,600,124.14)	(12,889,709.06)
ආපදාණය පොලී		(44,120.73)	(51,460.44)
(Repo) කෙටිකාලීන පොලී		(23,200.00)	(70,178.39)
වෙනත් ආදායම්		(100,780.00)	(13,770.00)
කාරක ප්‍රාග්ධනයේ විචලතාවය			
ගෙවියයුතු වෙනත් දෑ		27,368.31	(1,058,697.81)
වෙන්කිරීම්		622,962.50	228,944.00
ලැබියයුතු වෙනත් දෑ	සටහන 01	(357,266.00)	(30,365,540.00)
තොග වෙනස්වීම්		(636,592.38)	1,580,712.14
මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ගලා ඒම්		**6,273,103.53**	(19,504,899.03)
ආයෝජන කටයුතුවලින් මුදල් ගලා ඒම			
දේපල යන්ත්‍ර උපකරණ මිලට ගැනීම		(1,276,513.40)	(739,938.00)
ආයෝජන ආදායම්		11,097,424.30	10,196,967.96
ආපදාණය පොලී		44,120.73	51,460.44
Repo ආයෝජන පොලී		23,200.00	70,178.39
වෙනත් ආදායම්		100,780.00	**13,770.00**
දේපල යන්ත්‍ර උපකරණ විකිණීමෙන් ලැබීම්		39,755.00	-
රක්ෂණ හා මුද්දර යන්ත්‍රයට තැම්පත් කිරීම්		-	13,535.00
Web Base & ISO වෙනුවෙන් ආයෝජන		-	(29,700.00)
ස්ථාවර තැම්පතු පොළී		(18,000,000.00)	12,000,000.00
ආයෝජන කටයුතුවලින් ශුද්ධ මුදල් ගලා ඒම්		**(7,971,233.37)**	**21,576,273.79**
ශුද්ධ වැඩිවීම්/ අඩුවීම් මුදල් හා මුදල් සමාන අයිතම		(1,698,129.24)	**2,071,374.76**
වසරේ ආරම්භක මුදල් හා මුදල් සමාන අයිතම		3,802,821.01	**1,731,446.25**
වසර අවසානයේ මුදල් හා මුදල් සමාන අයිතම		2,104,691.77	3,802,821.01

සටහන 01 : 2019 වසරේ ගැලපීම් තුල ඇති ස්ථාවර තැන්පතු ගැලපීම හා කාරක ප්‍රාග්ධනය යටතේ ඇති වෙනත් ලැබියයුතු දෑ සකස්කර ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

01 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 වාර්තා කරණ ඒකකය

ශ්‍රම වාසනා අරමුදල 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනත හා 2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් (සංශෝධන) පනත මගින් සංස්ථාගත කර ඇත.

1.2 නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය

2021 ජනවාරි මස 21 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

1.3 වාර්තාකරණ කාලපරිච්ඡේදය

ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය කාලපරිච්ඡේදය 2020 ජනවාරි 01 දින සිට 2020 දෙසැම්බර් මස 31 වන දින දක්වා මාස 12 ක කාලපරිච්ඡේදය නියෝජනය කරයි.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

1.4.1 අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශන වලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශ වලට සටහන් ඇතුලත් වේ. මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම මත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS'S) අනුකූල ව පිළියෙල කොට ඉදිරිපත් කර ඇත.

1.4.2 මිනුම් කිරීමේ පදනම

වත්කම් නැවත ඇගයීම සඳහා ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම ගිණුම් වලට බලපාන උද්ධමනකාරී සාධකයන් ගණනය කොට නැත.

1.4.3 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූලතාවය දැක්වීම සඳහා ප්‍රමාණාත්මක, විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හා සැසඳිය හැකි වන පරිදි මූල්‍ය ප්‍රකාශ තුලින් වාර්තා කර ඇති සියලුම වටිනාකම් පෙර වර්ෂ වලට අනුව හෙලිදරව් කිරීම් කර ඇත.

අවශ්‍ය අවස්ථාවලදී වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීමට සංසන්දනාත්මක සංඛ්‍යා සංශෝධනය කර ඇත.

1.4.4 ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

ශ්‍රම වාසනා අරමුදලේ ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වටිනාකමෙන් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

1.4.5 ගිණුම්කරණ ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතය

මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී සහ ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදී විනිශ්චයන්, තීන්දු තීරණ හා උපකල්පන භාවිතයට ගැනීම අවශ්‍යය වන අතර ඒවායේ ඇති අවිනිශ්චිතභාවය නිසා අනාගත කාලසීමා සඳහා ඉදිරියට ගෙනයනු ලබන ශේෂයන්ගේ සුවිශේෂී ගැලපුම් සිදු කිරීමේ අවශ්‍යතාවය පැන නැගීමට ඉඩ ඇත.

ශ්‍රම වාසනා අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියා වලියේදී මුල්‍ය ප්‍රකාශන වල සුවිශේෂී බලපෑමක් කරනු සමත් පහත දැක්වෙන තීරණ නිශ්චය කිරීම් සහ උපකල්පන කළමණාකාරීත්වය විසින් සිදු කර ඇත.

අ) දේපල පිරියත හා උපකරණ වල ඵලදායී ජීව කාලය

වත්කමේ ඵලදායී ජීව කාලය, ක්ෂය කිරීමේ ක්‍රම වේදය හොඳම ඇස්තමේන්තුව මත පදනම්ව කළමණාකරණය විසින් තීරණය කරනු ලබන අතර එම නිසාම ඒවා අවිනිශ්චිතතාවයෙන් යුක්ත වේ.

ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණාත්මක විනිශ්චයන්වල යම් වෙනස්කම් මුල්‍ය වාර්තා වලට අදාල සටහන් තුල හෙලිදරව් කර ඇත.

ආ) අඛණ්ඩ පැවැත්ම

ශ්‍රම වාසනා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අවිනිශ්චිතතාවයක් ඇති වන සැලකිය යුතු කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හදුනා ගෙන නොමැති නිසා අරමුදලේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

මුල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම පදනමක් මත වන අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති එම කාලය පුරාම ක්‍රියාත්මක වේ.

1.5 වත්කම් හා වත්කම් තක්සේරු කිරීමේ පදනම

1.5.1 දේපල පිරියත හා උපකරණ (PPE)

අ) හදුනාගැනීම හා මිනුම්ගත කිරීම

දේපල පිරියත හා උපකරණ ඒවායේ අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය සතු වන්නේ දැයි හෝ එහි පිරිවැය දේපල පිරියත හා උපකරණ පිළිබද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව විශ්වාසදායී ලෙස මැනිය හැකි දැයි යන්න මත ඒවායේ ධාරණ අගය විනිශ්චය කිරීම හා ක්ෂය කිරීම හා ඒවාට අදාල හානිකරණ අලාභ හදුනා ගනු ලැබේ.

මුලික අදියරේ දී දේපල පිරියත හා උපකරණ එහි පිරිවැයට තක්සේරු කරනු ලබයි.

ආ) පිරිවැය

දේපල පිරියත හා උපකරණ වල පිරිවැය එහි මිලදී ගැණුම් පිරිවැය සහ එහි අදහස් කරන භාවිතය සහ කාර්යය මට්ටමට සෘජුවම දායක විය හැකි යම් පිරිවැය ඇතුලත් වේ.

දේපල පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කල පසු ලැබෙන පිරිවැයට දක්වනු ලැබේ.

ත්‍යාග වශයෙන් අරමුදලට ලද ලද වත්කම් සමුච්චිත අරමුදලට බැර කර දේපල පිරියත හා උපකරණ ගිණුමට හර කර ඇත.

ඇ) පසුකාලීන වියදම්

වත්කම් වල ඉපැයීමේ ධාරිතාව පවත්වා ගෙන යාම හෝ වැඩි කිරීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීම,ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීමේ අරමුණ සඳහා දැරෑ පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

ඈ) ක්ෂය වීම්

ඉඩම් හැර සෙසු වත්කම් ක්ෂය කිරීමේදී දේපල පිරියත හා උපකරණ අයිතම වල එක් එක් කොටස්වල ජීවිත කාලය පුරා සරල රේඛීය ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.වත්කම් භාවිතයට ගන්නා අවස්ථාවේ සිට වය ඉවත් කරන දිනය දක්වාම ක්ෂය කිරීම සිදු කරනු ලැබේ.

පහත ක්ෂය අනුපාත යටතේ ක්ෂය කරනු ලැබේ.

වාහන	10%
යන්ත්‍රෝපකරණ	20%
වායුසමීකරණ	20%
ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ	25%
පරිගණක	25%
ලී බඩු සහ සවිකිරීම්	10%
කාර්යාල උපකරණ	07.5%
මෘදුකාංග	20%

ඉ) අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් යනු මූල්‍ය වටිනාකමක් සහිත භෞතික නොවන වත්කම් වේ.

ඊ) හදුනාගැනීමේ පදනම

වත්කමක පිරිවැයට වඩා විශ්වාසවන්තව මැනිය හැකි මෙන්ම එම වත්කම අනාගත අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරය තුලට ගලා එන්නා වූ භෞතික පැවැත්මක් නොමැති වත්කම් මේ යටතේ හදුනා ගැනේ.

- ගිණුම්කරණ මෘදූකාංග

ආයතනය විසින් මිලදී ගන්නා ලද ගිණුම්කරණ මෘදූකාංග අත්පත් කර ගැනීමේ පිරිවැය මත මිනුම් කිරීම සිදු කරන අතර,පිරිවැයෙන් සමුච්චිත ක්‍රම ක්ෂය කපා හැරීම සිදු කරයි.

උ) අස්පෘශ්‍ය වත්කම් ක්ෂය

වත්කම භාවිතයට ගත් දිනයේ සිට වත්කම් ඵලදායී ජීවිත කාලය පුරා සරල මාර්ග ක්‍රමයට ක්‍රම ක්ෂය කිරීමෙන් ආදායම් ප්‍රකාශනයට ගැලපීම සිදු කරයි.

ඌ) වත්කම් ප්‍රත්‍යාගණනය

ප්‍රත්‍යාගණනය රජයේ පිළිගත් ඒ පිළිබඳ වෘත්තීය සුදුසුකම් ලත් පුද්ගලයෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් වාහන හැර අනෙකුත් සියලුම දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය (SLAPS 07) සිදු කර ඇත.

අරමුදලට පවරා දුන් KO 7519 කාර් රථය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අගය කර ඇත.සියලු නව ප්‍රත්‍යාගණන වටිනාකම් ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇත.

ඒ) ඉවත් කිරීම

දේපල පිරියත හා උපකරණ පවත්නා වටිනාකම ඒවා විකිණීමේදී හෝ එමගින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නොලැබෙන අවස්ථා වලදී ඉවත් කිරීම සඳහා හඳුනා ගැනේ. ප්‍රාග්ධන අයිතම බැහැර කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLAPS 07) අනුකූලව ගිණුම් ගත කර ඇත.

1.5.2 තොගය

තොගය පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ප්‍රකාශ කෙරේ තොගය බර තැබූ සාමාන්‍ය පිරිවැය මත නිකුත් කිරීම සිදු කර ඇත.

1.5.3 ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් වික්‍රැස් කරගත නොහැකි සියලුම වටිනාකම් සඳහා වන සියලුම බිල්පත් වල වටිනාකම වේ. ලැබිය යුතුගිණුම් ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් සහ ස්ථාවර තැන්පතු වලින් ලැබිය යුතු පොළිය වේ.

අ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුදල්

ශ්‍රම වාසනා අරමුදලට ලැබිය යුතු ප්‍රධාන ආදායම් ප්‍රභවය ජාතික සම්පත ලොතරැයි අලෙවිය මගින් ලැබෙන අලෙවි ආදායමෙන් 10% දායකත්ව දැක්විය හැකී සෑම මසකම එසේ ලැබෙන ලොතරැයි ආදායම ලොතරැයි මණ්ඩලය මගින් ඒකාබද්ධ අරමුදලට බැර කෙරෙන අතර අරමුදලේ වාර්ෂික අවශ්‍යතාවට අනුව කාර්තු වශයෙන් මුදල් නිකුත් කෙරේ.

ඒකාබද්ධ අරමුදල තුල ශ්‍රම වාසනා අරමුදල නමින් අරමුදලට ලැබිය යුතුව ඇති මුදල මෙමගින් නිරූපනය වේ.

ආ) ස්ථාවර තැන්පතු ලැබිය යුතු මුදල්

ශ්‍රම වාසනා අරමුදල නමින් රාජ්‍ය බැංකු හතරක පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතු මගින් වර්ෂයට අදාලව ලැබිය යුතු තිබුව තිබු නමුත් මෙතෙක් නොලැබු මුදල් වේ.

1.5.4 ආයෝජන

ආයෝජන වසරකට වඩා අඩු කාලයක් සඳහා වූ කෙටිකාලීන ආයෝජන සහ වසරකට වඩා වැඩි කාලයක් සඳහා වූ දිගුකාලීන ආයෝජන වලින් යුක්ත වේ.මාස තුන මාස හය සහ අවුරුද්දක කාලයක් සඳහා ස්ථාවර තැන්පතු වල සිදු කරන ලද කෙටිකාලීන ආයෝජනයන්ද, ශ්‍රම වාසනා අරමුදලේ වෙබ් අඩවිය සහ පරිඝණක ගත තොරතුරු පද්ධතිය සහ ප්‍රමිත සහතිකය ලබා ගැනීම තෙක් සිදු කරන ලද දිගුකාලීන ආයෝජනයන් ද නිරූපනය වේ.

මුදල් හා මුදල් හා සමාන අතැති මුදල් සහ බැංකු තැන්පතු වලින් සමන්විත වේ.

1.6 වගකීම් සහ වෙන්කිරීම්

ශේෂ පත්‍ර දිනට පවතින සියලුම ප්‍රමාණාත්මක වගකීම් මුල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කර ඇති අතර ශේෂ පත්‍ර දිනට පවතින නමුත් වටිනාකම නිවැරදිවම අගය කල නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීම් සිදු කොට ඇත. මුල්‍ය තත්ව ප්‍රකාශයේ සඳහන් දින සිට වසරක් ඇතුලත ඉල්ලුම මත ගෙවිය යුතු බැදීම් මුල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් වශයෙන් සැලකේ.මුල්‍ය තත්ව ප්‍රකාශයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වගකීම් මුල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් වශයෙන් සැලකේ.

1.6.1 විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් හා ප්‍රතිපාදන

අ) පාරිතෝෂික ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම

1983 අංක 12 හි පාරිතෝෂික පනත ට අනුව ශ්‍රම වාසනා අරමුදල පාරිතෝෂික ගෙවීමට බැඳී සිටී.ඒ සඳහා ගණනය කරන ලද වෙන්කිරීම් මුල්‍ය ප්‍රකාශනය තුල නිරූපනය කෙරේ.

ආ) දායක සැලසුම් අර්ථ දැක්වීම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා සුදුසුකම් ලබන සියලුම සේවකයින් අදාළ ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව අදාළ දායක අරමුදල් මගින් ආවරණය කෙරේ.

සේවකයාගේ මුලු වේතනයෙන් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සඳහා 12% ක් සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා 3% ක් අරමුදල විසින් දායක කරනු ලැබේ.

ඇ) නීති ආධාර ලබා දීම් සඳහා වෙන් කිරීම

ශ්‍රම වාසනා අරමුදලේ එක් අරමුණක් වන නීති ආධාර ලබා දීමේදී නඩුව විභාග වන අතර තුර පළමු නීති ආධාර වාරික මුදල් ලබා දෙන අතර දෙවන වාරික මුදල් නඩු වේ නියෝගය ලැබුණු පසු ලබා දීම සිදුවේ වර්ෂය තුලදී අවසන් නියෝගය නොලද නඩු සඳහා මෙම වෙන් කිරීම් සිදු කර ඇත.

1.7.1 ආදායම/අයභාරය

වාර්තාකරණ කාලපරිච්ඡේදය තුලදී ලැබීම් ස්වභාවයේ හෝ ශුද්ධ වත්කම් / ස්කන්ධයේ වැඩි වීමේ ප්‍රතිඵලයක් සේ ලැබෙන ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවන්හි දළ ගලා යාමකි. ආදායම හා පොළී ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරන අතර ආදායමෙහි ජාතික සම්පත ලොතරැයි ආදායම, ස්ථාවර තැන්පතු පොළී ආදායම ප්‍රධාන වේ.

1.7.2 වියදම

වාර්තාකරණ කාලපරිච්ඡේදය තුලදී ගලායෑම් ස්වාභාවයෙන් හෝ වත්කම් පරිභෝජන ස්වාභාවයෙන් හෝ බැරකම් ඇතිවීමේ ස්වාභාවයෙන් සිදුවන ආර්ථික ප්‍රතිලාභයන්ගේ හෝ සේවා ශක්‍යතාවයන්ගේ අඩු වීමකි.

ශ්‍රම වාසනා අරමුදලේ කටයුතු පවත්වා ගෙන යාම, අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමෙහිලා සිදු කරන ප්‍රාග්ධන සහ අයභාර ස්වභාවයේ සියලුම දෑ වේ.

1.8 ශේෂ පත්‍ර දිනට පසු සිදු වීම්

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන වැදගත් ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගෙන මුල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සහ අනාවරණයන් සිදු කිරීමට කටයුතු කර ඇත.

1.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS 2) අනුකූලව "වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහය සකස් කර ඇත.

(රුපියල්)

සටහන් 01

පිරියත යන්ත්‍ර හා උපකරණ

01-1

පිරිවැය

	ප්‍රත්‍යාගණන ශේෂය 2020-01-01	එකතු කිරීම්	අපහරණය/කපා හැරීම්/ගැලපීම්	ශේෂය 2020-12-31
වාහන	12,882,500.00	-	-	12,882,500.00
යන්ත්‍ර හා උපකරණ	101,050.00	-	2,000.00	99,050.00
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	214,800.00	7,300.00	-	222,100.00
වායුසමීකරණ යන්ත්‍ර	180,000.00	-	-	180,000.00
පරිගණක	1,948,525.50	1,103,331.80	45,333.00	3,006,524.30
ලී බඩු හා සවි කිරීම්	629,500.00	127,596.60	5,000.00	752,096.60
කාර්යයාල උපකරණ	147,112.50	38,285.00	4,000.00	181,397.50
	16,103,488.00	**1,276,513.40**	**56,333.00**	**17,323,668.40**

01-2

ක්ෂය

	ප්‍රත්‍යාගණන ශේෂය 2020-01-01	වසරේ ක්ෂය	අපහරණය/කපා හැරීම්/ගැලපීම්	ශේෂය 2020-12-31
වාහන	2,848,040.14	1,288,250.00	-	4,136,290.14
යන්ත්‍ර හා උපකරණ	3,875.90	19,971.75	239.56	23,608.09
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	10,298.63	54,123.84	-	64,422.47
වායුසමීකරණ යන්ත්‍ර	6,904.11	36,000.00	-	42,904.11
පරිගණක	86,779.97	568,664.82	6,793.03	648,651.76
ලී බඩු හා සවි කිරීම්	12,072.60	67,812.39	423.72	79,461.27
කාර්යයාල උපකරණ	2,176.41	13,516.50	179.88	15,513.03
	2,970,147.76	**2,048,339.30**	**7,636.19**	**5,010,850.87**

සටහන් 02
අස්පෘශ්‍ය වත්කම්

	පිරිවැය 2020-01-01	එකතුවීම්	අපහරණය/කපා හැරීම්/ගැලපීම්	ශේෂය 2020-12-31
මෘදුකාංග	30,000.00	-	-	30,000.00
	30,000.00	-	-	30,000.00
ක්‍රමක්ෂය කිරීම්				
මෘදුකාංග	1,149.77	6,000.00	-	7,149.77
	1,149.77	6,000.00	-	7,149.77

සටහන් 03
මුදල් හා මුදල් සමාන අයිතම

මහජන බැංකුව - 119100103693128	2,094,691.77
මහජන බැංකුව - 119100293693128	10,000.00
	2,104,691.77

(රුපියල්)

සටහන් 04 **වෙනත් ලැබියයුතු දෑ**	
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	332,140,520.18
උත්සව අත්තිකාරම්	10,000.00
අපදා ණය	1,490,866.00
ස්ථාවර තැම්පතු පොලි	2,694,529.38
ගෙවියයුතු තැන්පත්	3,000.00
	336,338,915.56
සටහන් 05 **තොගය**	
ලිපිද්‍රව්‍ය	642,406.04
වැඩසටහන් වෙනුවෙන් ගත් ද්‍රව්‍ය	852,739.03
	1,495,145.07
තොගයන් සාමාන්‍ය බරතැබූ ක්‍රමය අනුව ගණනය කර ඇත.	
සටහන් 06 **සමුච්චිත අරමුදල්**	
සමුච්චිත අරමුදල් 2020-01-01	449,361,882.11
2020 වසරේ අතිරික්තය	12,330,516.67
2020-12-31 දිනට සමුච්චිත අරමුදල්	**461,692,398.78**
සටහන් 07 **වෙනත් ගෙවියයුතු දෑ**	
දුරකතන බිල්	27,282.37
වෙනත් ගෙවියයුතු දෑ	130,453.78
ජල හා විදුලි බිල්	1,676.73
	159,412.88
සටහන් 08 **වෙන්කිරීම්**	
නීති ආධාර සඳහා වෙන් කිරීම්	687,000.00
බෙරුම්කරණය සඳහා වෙන් කිරීම්	20,000.00
නීති සහණාධාර සඳහා වෙන් කිරීම්	-
Web Base System වෙනුවෙන් වෙන් කිරීම්	32,500.00
විගණන ගාස්තු වෙනුවෙන් වෙන් කිරීම්	500,000.00
	1,239,500.00

(රුපියල්)

සටහන් 09 **ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමයට පහත අනුපාතයන් ට අනුව ක්ෂය කර ඇත**	
වාහන	10%
යන්ත්‍ර හා උපකරණ	20%
වායුසමීකරණ	20%
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	25%
පරිගණක	25%
ලී බඩු හා සවිකිරීම්	10%
කාර්යාලීය උපකරණ	7.50%
මෘදුකාංග	20%
ක්ෂය කළ හැකි වත්කම් වල අවසාන අගය රුපියල් 1 ක් වන සේ ක්ෂය කර ඇත.	
සටහන් 10 **අදායම්**	
ලොතරැයි ආදායම	30,034,400.00
ස්ථාවර තැම්පතු පොලී	7,600,124.14
ආපදා ණය පොලී	44,120.73
කෙටි ආයෝජන (Repo) ආදායම	23,200.00
වෙනත් ආදායම්	100,780.00
	37,802,624.87

(රුපියල්)

සටහන් 11 **පරිපාලන වියදම්**	
වැටුප් හා වේතන	6,762,442.11
සේ.අ.අ	1,751,155.80
සේ.භා.අ	262,673.37
ජීවනාධාර දීමනා	1,497,600.00
වෙනත් දීමනා	230,160.00
සභාපති දීමනා	207,725.00
ප්‍රායෝගික පුහුණු දීමනා	42,096.77
අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	326,470.00
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් දීමනා	15,000.00
අභ්‍යන්තර විගණක දීමනා	30,000.00
වෘත්තීය දීමනා	180,000.00
සේවක පාරිතෝෂික	180,962.50
අතිකාල හා නිවාඩු දීමනා	155,445.72
ගමන් වියදම්	66,915.19
ප්‍රවාහන වියදම්	276,282.00
ලිපිද්‍රව්‍ය හා වෙනත්	430,608.17
තැපැල් වියදම්	24,660.00
දුරකතන	290,708.81
සංග්‍රහ වියදම්	32,347.90
කෙටි ආහාර හා වෙනත්	130,409.25
විවිධ වියදම්	12,542.50
වෙනත්	21,371.00
විගණන වියදම්	300,000.00
විදුලිය හා ජලය	39,472.61
වෙනත් සේවා	337,053.38
නඩත්තු හා අලුත්වැඩියා	647,234.90
සේවක සුභසාධනය	204,000.00
සේවක පුහුණුව	276,500.00
	14,731,836.98
සටහන් 12 **ක්ෂය**	
වාහන	1,288,250.00
පරිගණක	568,664.82
වායුසමීකරණ	36,000.00
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	54,123.84
ලී බඩු හා සවිකිරීම්	67,812.39
කාර්යාලීය උපකරණ	13,516.50
යන්ත්‍ර හා උපකරණ	19,971.75
මෘදුකාංග ක්‍රමක්ෂය	6,000.00
	2,054,339.30

(රුපියල්)

සටහන් 13 **අරමුණු අත්පත්කරගැනීම වෙනුවෙන් දරණ ලද වියදම්**	
සවිබල ගැන්වීමේ වැඩසටහන	1,537,772.17
දැනුවත් කිරීමේ වැඩසටහන	338,070.00
සුභසාධන වැඩසටහන	563,834.68
කෘතීම අත් හා පාද ලබාදීමේ වැඩසටහන	46,500.00
නීති ආධාර වැඩසටහන	654,005.04
නීති ආධාර අභියාචනා	30,000.00
ශිෂ්‍යත්ව වැඩසටහන	4,961,372.03
	8,131,553.92
සටහන් 14 **වෙනත් වියදම්**	
ලොතරැයි අලෙවිය/ දැනුවත් කිරීම	336,119.00
ISO අලුත් කිරීම	218,259.00
	554,378.00
සටහන් 15 **පෙර වර්ෂයේ ගැලපීම්**	
වත්කම් විකිණීමේ අලාභය	(8,941.81)
	(8,941.81)
15.1	
කම්කරු දෙපාර්තමේන්තුව සහ කම්කරු අමාත්‍යංශය විසින් පවරන ලද අංක KO 7519 දරණ කාර් රථය සහ ගෘහ භාණ්ඩ සමුචිත අරමුදලෙන් රාජ්‍ය ප්‍රධාන ගිණුමට මාරු කිරීම.	
සටහන් 16	
නාරාහේන්පිට මහජන බැංකු ශාඛාවේ සභාපති ශ්‍රම වාසනා අරමුදල නමින් ජංගම ගිණුම් දෙක-ක් පවත්වාගෙන යයි. අංක 119100293693128 දරණ ජංගම ගිණුම E-CARD පහසුකම වෙනුවෙන් රු.10,000.00 වටිනාකමක් වෙනුවෙන් ආරම්භකර ඇත.	
සටහන් 17 **සංසන්දනාත්මක තොරතුරු**	
ප්‍රවර්තන වසරේ තොරතුරු තහවුරු කිරීම සඳහා අවශ්‍ය ස්ථානවල කලින් වසරේ තොරතුරු ඉදිරිපත් කර ඇත.	
සටහන් 18 **කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂ වරුන්ගේ උනන්දුව**	
අරමුදලේ කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු අධ්‍යක්ෂවරයකුට සෘජු හෝ වක්‍ර උනන්දු-වක් නැත.	
සටහන් 19 **අධ්‍යක්ෂ වරුන්ගේ වගකීම**	
මූල්‍ය වාර්තා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරණු ලබයි.	

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ්/ඒ/එස්වීඑෆ්/6/2020/3 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 ජූනි 30 දින

සභාපති,
ශ්‍රම වාසනා අරමුදල.

ශ්‍රම වාසනා අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රම වාසනා අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනතේ 12(4) උපවගන්තියේ සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තක්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.7,600,124 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, උපලේඛන අනුව පොලී ආදායම රු.8,591,293 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායමෙහි උපලේඛණ හා මූල්‍ය ප්‍රකාශ අතර රු.991,169 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ආයෝජනය කරන ලද රු.මිලියන 05 ක ස්ථාවර තැන්පතුවක් සඳහා ලැබිය යුතු පොලිය රු.129,808 ක් සාවද්‍ය ගණනය කිරීම හේතුවෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2020 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රදාන ලෙස අරමුදලට පවරන ලද රු.3,625,500 ක් වූ ස්ථාවර වත්කම් හා අරමුදල විසින් පැවැත්වීමට සැලසුම් කළ හා පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර ඇතුලත් කර සකස් කර තිබූ පිරිවැය රු.2,774,958 ක් වූ වෙබ් අඩවි පද්ධතිය (web based system) නම් වූ පරිගණක මෘදුකාංගය, හඳුනාගන්නා ලද ප්‍රතිශතයක් මත ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම් හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව		නිරීක්ෂණ
(අ) **1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත සහ 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනත**		
(i)	3 : 4 : (2 ඇ) උප වගන්තිය	කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බෙරුම්කරුවෙකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තකයකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබාගැනීමට, මූල්‍යමය සහන සැලසීමට තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයකට යටත් විය යුතු වුවත්, මෙම නීති ආධාර ලබාදීමට අදාල රීති 2020 දෙසැම්බර් 31 දිනටත් පිළියෙල කර නොතිබුණි.
(ii)	13:1 හා 13:2(අ) උප වගන්ති	අරමුදල හා ලොතරැයි මණ්ඩලය එකඟවනු ලැබිය හැකි යම් ලොතරැයි සංඛ්‍යාවක්, ලොතරැයි වර්ග හා එසේ පවත්වන

	ලොතරැයිවලදී ප්‍රදානය කරන තෑගි පිළිබඳව, ඒ ලොතරැයිවලදී හිමිකම් කියා නොසිටින තෑගි සම්බන්ධව කටයුතු කරන ආකාරය පිළිබඳව, සහ ලොතරැයිවලින් ලැබෙන මුදල්වලින් අරමුදල සඳහා වෙන්කල යුතු මුදල් ප්‍රමාණය පිළිබඳව විධිවිධාන ඇතුලත් විය යුතු වුවත්, අරමුදල හා ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ එවැනි විධිවිධාන සම්බන්ධයෙන් එකඟතාවයක් ඇතිකර ගෙන නොතිබුණි.
(iii) 14 : 1 උප වගන්තිය	මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කෙරෙහි බලපවත්වන හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය යැයි මණ්ඩලය සලකන රීති පිළියෙල කර මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද එම රීති 2021 අප්‍රේල් 08 දින දක්වාම ගැසට් පත්‍රයේ පල කර නොතිබුණි.
(ආ) <u>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16:2 වගන්තිය</u>	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඩ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) අරමුදලේ මෙහෙයුම් කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම සඳහා රඳවා තබාගත යුතු බැංකු ශේෂය හඳුනාගෙන අතිරික්ත මුදල් කෙටිකාලීනව ආයෝජනය කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සෑම මාසයක් අවසානයේම රු.මිලියන 2 සිට රු.මිලියන 14 ක් දක්වා වූ මුදල් ප්‍රමාණයන් ජංගම ගිණුමේ නිෂ්කාර්යව පැවතුණි. එමඟින් අරමුදලට උපයාගත හැකිව තිබූ පොලී ආදායම අහිමි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය බැංකු 03 ක ආයෝජනය කර තිබූ රු.95,000,000 ක ස්ථාවර තැන්පතු කල්පිරී තිබූ අතර, නැවත ආයෝජනය කිරීමේදී පොලී අනුපාත සංසන්දනය කර වඩාත් ලාභදායී ආයෝජන මාර්ග තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) COVID - 19 හේතුවෙන් රැකියා අහිමි වූ සේවා නියුක්තිකයන්ගේ දුදරුවන් 2,500 ක් සඳහා පාසල් බෑග් සහ උපකරණ කට්ටල ලබාදීමට රු.6,250,000 ක ඇස්තමේන්තුවක් සකස් කර කම්කරු බල ප්‍රදේශ 11 ක් ආවරණය වන පරිදි කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් අවශ්‍ය තොරතුරු හා අයදුම්පත් කැඳවා තිබුණු අතර ඒ අනුව . 2020 දෙසැම්බර් 31 දින වන විට අයදුම්පත් 330 කට අධික ප්‍රමාණයක් ලැබී තිබුණි. එම සමාජීය වගකීම් ඉටුකිරීම කාලීන අවශ්‍යතාවයක් මෙන්ම පනතේ 6 (ඉ) උප වගන්තියේ අරමුණුවලට වඩාත් යෝග්‍ය වූ වැඩසටහනක් වුවද 2021 මාර්තු 15 දිනටත් වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති පුද්ගලයින් ඇගයීමේ උත්සවයක් පැවැත්වීමට 2017 අගෝස්තු 15 දින කමිටුවක් පත් කර තිබූ අතර අදාළ කමිටු වාර්තාව ලබාදීමට මාස 6 ක් ප්‍රමාද වී තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මුලින්ම තීරණය කර තිබූ පරිදි සේවායෝජකයන් 03 දෙනෙකු, සේවානියුක්තිකයන් 04 දෙනෙකු හා රාජ්‍ය නියෝජිතයින් 03 දෙනෙකු වශයෙන් ත්‍රෛපාර්ශවයම නියෝජනය වන පරිදි පුද්ගලයින් 10 දෙනෙකු තෝරාගත යුතු වුවද, පත්කරන ලද කමිටුව විසින් තීරණය කර තිබූ පරිදි වෘත්තීය සමිති කටයුතුවල වසර 35 කට වැඩි කාලයක් යෙදී සිටි පුද්ගලයින් 10 ක් පමණක් පුවත්පත් දැන්වීම් පලකර තෝරාගෙන තිබුණි. කෙසේවුවද, 2020 දෙසැම්බර් 31 දක්වා මෙම උත්සවය වෙනුවෙන් පූර්ව වීඩියෝගත කිරීම්, පුවත්පත් දැන්වීම්, කමිටු සාමාජික දීමනා ඇතුළු මූලික වියදම් සඳහා රු.708,897 ක් වැයකර තිබුණද 2021 මාර්තු 15 දින වන විටත් උත්සවය පවත්වා නොතිබුණි.

2.3 අනෙකුත් විගණන නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2020 වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණන සැලැස්මක් පමණක් පිළියෙල කර තිබූ නමුත් අභ්‍යන්තර විගණනයන් සිදුකර වාර්තා නිකුත් කර නොතිබුණි. තවද, 2020 මාර්තු මාසයෙන් පසුව අරමුදලේ අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර පුරප්පාඩුව පැවතුණි.

(ආ) 2016 වර්ෂයට පෙර වැඩසටහන් සඳහා බෙදාදීමට මිලදී ගන්නා ලද රු.60,464 ක් වටිනා උපකරණ තොග අයිතමයන් 10 ක් 2020 දෙසැම්බර් 31 දිනටත් වලනය නොවන තොග අයිතමයන් ලෙස ගබඩාවේ පැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය

ශ්‍රම වාසනා අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය.

1.2

(අ) පෙර වර්ෂයට ගැලපීම් සිදු කිරීම ඉදිරි ගිණුම් ප්‍රකාශන තුල නිවැරදිව දැක්වීමට සටහන් කරගෙන ඇත.

(ආ) සිදු වී ඇති අතපසු වීම නිවැරදිව කර 2021 වර්ෂයේ දී ගිණුම් වාර්තා තුළ නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ඇත.

(ඇ) 2021 ගිණුම් ප්‍රකාශය තුළ රජයේ ප්‍රදාන හඳුනා ගන්නා ලද ප්‍රතිශතයක් මත ක්‍රමක්ෂය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ වෙබ් අඩවි මූලික කර ගත් පද්ධතිය ආයොජන තුලින් ඉවත් කර අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම් ගත කර හඳුනාගන්නා ලද කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමක්ෂය කිරීමට කටයුතු යොදනු ඇත තවද ඒ පිළිබඳ නිසි හෙළිදරව් කිරීම් ගිණුම් ප්‍රකාශන වල සිදු කරනු ලැබේ.

2.2.2 (අ)

I. 2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් සංශෝධිත පනතේ විධිවිධාන ප්‍රකාරව රීති සකස් කිරීමට අදාල වූ 5(2A) වගන්තිය සහ 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ 14 වන වගන්තියට අනුව රීති සකස් කිරීම වෙනුවෙන් වූ කෙටුම්පත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව රීති ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. (1.5. අ.i.ii) විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති පරිදි 2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ රීති සකස් කිරීමට අදාල 3(3) වගන්තිය සහ 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ රීති සකස් කිරීමට අදාලවූ 3(3)g(ii) වගන්තියෙහි සඳහන් කරුණුද එක්කර මේ වන විට අදාල රීති ගැසට් පත්‍රයේ පළ කිරීම පිළිබඳ සලකා බැලීමට මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇතී එම කටයුතු සිදුකළ යුතුද යන්න ඒ අනුව පරීක්ෂා කර බලනු ඇත.

II. 2017 වර්ෂයේ සිට ලොතරැයි මණ්ඩලය සමඟ ඇති කර ගත යුතු එකඟතාවයේ කෙටුම්පතක් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර 2017 වර්ෂය සිට මේ දක්වා වාර්ෂිකව මේ පිළිබඳව මුදල් අමාත්‍යාංශය දැනුවත් කළ ද ඒ සම්බන්ධයෙන් එකඟතාවක් පළ වී නොමැතිකෙසේ වුවද මේ පිළිබඳව සාකච්ඡා කිරීමට ඉදිරියේදී අවස්ථාවක් ලබා දෙන බව වාචිකව ප්‍රකාශ කර ඇත.

III. මේ පිළිබඳ මුදල් අමාත්‍යාංශය වෙත ගැසට් කිරීම ඉක්මනින් සිදු කර ගැනීම පිළිබඳ 2021ී08ී30 දිනැති සිහි කැඳවීම් ලිපිය යොමු කර ඇත.

(ආ)

2021 වසරේ සිට මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවද විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන අතර 2020 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව 2021ී08ී31 දින පෙර විගණකාධිපතිට සහ මුදල් අමාත්‍යාංශය වෙත භාර දී ඇත.

2.4.4

(අ) මුදල් පොතේ බැංකු ගිණුමේ ශේෂය රු.මිලියන 5 ට වඩා වැඩි වන අවස්ථාවේදී REPO ලෙස මහජන බැංකුවේ භාණ්ඩාගාර ඒකකයේ කෙටි කාලීන ආයෝජන වල යොදවා පොළී ආදායම ලබා ගැනීමටත්, රු.මිලියන 5 ට වඩා අඩු අවස්ථාවන් වලදී ඉල්ලුම් තැන්පතු වල යොදවා පොළී මුදල් උපයා ගැනීමටත්, 2021.04.20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. බැංකු ශේෂය රු.මිලියන 5 ට වඩා වැඩි අවස්ථා වලදී එය REPO ආයෝජනයන්හි යෙදවීමත් ජංගම ශේෂය රු.මිලියන 5 ට වඩා අඩු වන විට ඉල්ලුම් තැන්පතු වැනි කෙටි කාලීන ආයෝජන ලෙස ආයෝජනයන්හි යෙදවීමටත් කටයුතු කර ඇත. 2021.08.21 දින මහජන බැංකුවේ ඉල්ලුම් තැන්පතු ලෙස ආයෝජනය කර පොළී ආදායම ලබා ගැනීමට කටයුතු කර ඇත.

(ආ) PED 2/2018 චක්‍රලේඛයට අනුව රාජ්‍ය බැංකු වලින් පොළී අනුපාත කැඳවා ඒවා සංසන්දනය කර ඉහළ පොළී අනුපාතිකයක් ලබා දෙන රාජ්‍ය බැංකුවක ආයෝජනය කරනු ඇත. රටේ පවතින වසංගත තත්ත්වය හේතුවෙන් බැංකු වසා තිබීමත්, බැංකු නිලධාරීන්ගේ පැමිණීම සීමා වීම මත එවන් අවස්ථාවලදී අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් අනුව අවම වශයෙන් දවසක හෝ පොළිය ආයතනයට අහිමි නොකර එම බැංකුවේහිම ආයෝජනය කිරීම එනම්, ඒ වන විට ඉහළ පොළී අනුපාතිකයක් පැවති මහජන බැංකුව තුළම ආයෝජනය කිරීමට කටයුතු සිදු කරන ලදී. නමුත්, පාරදෘශ්‍යභාවය රැකෙන පරිදි 2021 වර්ෂය තුල මේ දක්වා රාජ්‍ය බැංකු තුලින් පොළී අනුපාත කැඳවා ඉහළ පොළී අනුපාතිකයක් ඇති බැංකුවෙහි ආයෝජනය කිරීමට කටයුතු යොදා ඇත.

(ඇ) කොවිඩ් 19 වසංගත තත්වය නිසා දිගුකාලයක් පාසල් වසා දමා ඇති අවස්ථාවක පාසල් උපකරණ ලබා දීම ප්‍රායෝගිකව ඵලදායී නොවන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දුන් උපදෙස් පරිදි වැඩසටහන සිදු නොකිරීමට තීරණය විය.

(ඉ) රටේ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් මේ වසරේ මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමේදී ගැටලු මතු විය. මෙම වැඩසටහන සිදු කිරීමට අදාලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුලින් වියදම් වෙන් කර ඊට අදාළ ඇස්තමේන්තුව නැවත සංශෝධනය කර අනුමත කර ගැනීමට සිදු විය. දිගින් දිගටම මෙම උත්සවය පැවැත්වීමට නොහැකි වීම මත 2021 සැප්තැම්බර් 29 දින මෙම උළෙල ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට දින වෙන් කර තිබුණද එවැනි වැඩසටහන් සිදු කිරීම සඳහා සුදුසු වාතාවරණයක් රටතුළ නොවූයෙන් සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව ඒ සඳහා අවස්ථාව විවර වී නොමැති වීම හේතුවෙන් එය තවදුරටත් කල් දැමීමට සිදු විය. ඉදිරියේදී මෙම උළෙල සංවිධානය කිරීමට හැකියාවක් ලැබෙන වාතාවරණයක් උදා වූ විට නැවත අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කර නිසි ඇස්තමේන්තු සකසා අනුමැතිය ලබා ගැනීමට නියමිතය.

මෙසේ තෝරා ගනු ලැබූ ප්‍රතිලාභීන්ගේ සුදුසුකම් නැවත සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත කම්කරු අමාත්‍යාංශයේ වත්මන් ලේකම්තුමාගේ මඟ පෙන්වීම යටතේ පත්කරන ලද කමිටුවක් මඟින් ප්‍රතිලාභී නාම ලේඛණය නැවත පරීක්ෂා කර නිර්නායකයන්ට අනුකූලභාවය පිළිබඳව නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කර ඇත.

විගණනය විසින් විමසා සිටි කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමුකළ අතර එම වැඩසටහන කම්කරු නායකයින් උදෙසා සිදු කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නැවත අනුමත කර ඇත.

මෙම වැඩසටහනට අදාළව නිලධාරීන් 03 දෙනෙකුගෙන් යුත් කමිටුවක් ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලදී. එම කමිටුවේ නිර්දේශයන් මත වෘත්තීය සමිති නායකයන් ඇගයීමට අධ්‍යක්ෂ මණ්ඩලයද තීරණය කරන ලදී. ඒ අනුව එම පාර්ශවයෙන් පුවත්පත් දැන්වීමක් පල කර අයදුම් පත්‍ර කැඳවා, ඉහළ ලකුණු ලබා ගත් 10 දෙනා 2018.03.22 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් අනුමත කරන ලදී. ගරු කම්කරු ඇමතිතුමාගේ විශේෂ ඉල්ලීමක් මත තෝරා ගත් වෘත්තීය සමිති නායකයා 2018.07.24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම තෝරා ගැනීම් ක්‍රමවේදයේ ඇති පාරදෘශ්‍යභාවය නැවතත් පරීක්ෂා කිරීම සඳහා වර්තමාන කම්කරු අමාත්‍යතුමන්ගේ ඉල්ලීම පරිදි කම්කරු අමාත්‍යාංශයේ ලේකම්තුමන් විසින් කමිටුවක් පත් කර 2021/01/19 දින වාර්තාවක් ලබා ගන්නා ලදී.

ඇගයීමට ලක්කරන ප්‍රතිලාභීන්ගේ විස්තර ඇතුලත් වීඩියෝව සඳහා මෙම වියදම් දරණ ලද අතර, එය ඉදිරි වැඩසටහන් සඳහා යොදවා ගත හැකි බවත්, සෞඛ්‍ය මාර්ගෝපදේශ මත ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ලබා දෙන ඉදිරි දිනයකදී මෙම වැඩසටහන සිදු කිරීමට කටයුතු කරනු ඇති බවත් දන්වමි.

2.3

(ආ) ශ්‍රම වාසනා අරමුදල සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට අදාලව 2021.10.04 දිනැති ලිපිය මුදල් අමාත්‍යාංශය මඟින් එවා ඇත.

(ඇ) මෙම තොගයෙහි ඇතැම් අයිතමයන් 2021.10.18 දිනැති ලිපිය මඟින් ජාතික ලොතරැයි මණ්ඩලය වෙත භාර දී ඇත.

ඉතිරි අයිතම කිහිපය සෞඛ්‍ය මාර්ගෝපදේශ ලිහිල් කළ විගස ඉදිරි ශිෂ්‍යත්ව වැඩසටහන් වෙනුවෙන් යොදා ගැනීමට කටයුතු කරනු ඇත.

ජූඩ් නිලුක්ෂාන්
සභාපති
ශ්‍රම වාසනා අරමුදල

ඇමුණුම

2020 වර්ෂයේ ශ්‍රම වාසනා අරමුදලේ කාර්යසාධනය

01. දැනුවත් කිරීමේ වැඩසටහන්

- 2020 පෙබරවාරි මස 17 හා 18 දෙදින
  - පිටරත්මලේ තේ කර්මාන්තශාලාව
  - සමර් ෆැෂන් ආයතනය
  - දඹේතැන්න තේ කර්මාන්තශාලාව
  - හපුතලේ වත්ත තේ කර්මාන්තශාලාව
  - කම්කරු කාර්යාලය - හපුතලේ
  - Glenore State - හපුතලේ
- 2020 පෙබරවාරි මස 27 වන දින විවෘත විශ්වවිද්‍යාලය - නාවල
- 2020 මාර්තු මස 06 වන දින BOI - කොග්ගල
- 2020 මාර්තු මස 06 හා 07 දෙදින හයිලන්ඩ් කර්මාන්තශාලාව - අඹේවෙල
- 2020 ජූලි 17 වන දින මිනිස්බල දෙපාර්තමේන්තුව
- 2020 ජූලි 21 වන දින 10 වන මහළ - කම්කරු දෙපාර්තමේන්තුව

02. මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන

- 2020 ජූනි මස 06,08,09 හා 10 දිනවල
  - කම්කරු කාර්යාලය - මාතර
  - කම්කරු කාර්යාලය - හම්බන්තොට
  - කම්කරු කාර්යාලය - කළුතර
  - කම්කරු කාර්යාලය - ගම්පහ
  - කම්කරු කාර්යාලය - කුරුණෑගල
  - කම්කරු කාර්යාලය - මහනුවර
  - කම්කරු කාර්යාලය - කෑගල්ල
  - කම්කරු කාර්යාලය - නුවරඑළිය
  - කම්කරු කාර්යාලය - බදුල්ල
  - කම්කරු කාර්යාලය - රත්නපුර

03. සවිබල ගැන්වීමේ වැඩසටහන්

- 2020 පෙබරවාරි මස 14 වන දින මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- 2020 පෙබරවාරි මස 20 වන දින මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- 2020 පෙබරවාරි මස 13 වන දින බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- 2020 පෙබරවාරි මස 18 වන දින තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය